2026.07.05 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 50 වැනි කලාපය

දැන් ඉරිදා

රු.100


# මව්බිම

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ

**ගුරුදු විග්‍රහය**



## අගවිනිසුරු පත්කිරීම

P ≫ 04





## යෝෂිතට වරදියි

P ≫ 02

## ජනාධිපති පුතෙක් ඇතුළට

P ≫ 02

## ඇමැතිලත් වරද්දා ගනී

රටට බත සපයන ගොවියන්ට අපහාසාත්මක ආකාරයට ප්‍රකාශ නිකුත් කිරීමට විරෝධය පළකරමින් ආණ්ඩුවේ ප්‍රධාන අමාත්‍යවරුන් කිහිප දෙනකුට එරෙහිව දැවැන්ත අරගලයක් ආරම්භ...

P ≫ 02

# සජිත්-අනුර හදිසි දුරකතන සාකච්ඡාවක්

P ≫ 02

## IMF එක ඩබල් ගේමක

**උඩින් එකයි - යටින් එකයි**

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික ස්ථාවරත්වය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රසිද්ධියේ ප්‍රශංසා කළද...

P ≫ 02

## විජේගේ ආණ්ඩුව වැටෙයි

P ≫ 03





## ගොවි කැරැල්ලක් අත ළඟ

P ≫ 02

## ගොවියෝ රැකගන්න සජබ පෙරට

P ≫ 02

## නීතිඥ ගාස්තු ගෙවන්න වකුගඩු විකුණන්න වෙලා

P ≫ 10

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කෝදාගොඩ

## ජූලි 7න් පස්සේ මහා කලබලයක්

P ≫ 09

KCJගෙන් තවත් ප්‍රබල අනාවැකියක්

## චීනය සජිත්ට?

P ≫ 06

## ටිල්වින් නැගිට යයි

P ≫ 07

## කාදිනල් හිමි විශ්‍රාම යයි

P ≫ 06

## රට පැන්න පාතාල ලැයිස්තුව මෙන්න

P ≫ 12





ශ්‍රී ලාංකේය අනාගතයේ
අක්මුල් පෝෂණය කරන

**BOC AGRI BANKING UNIT**

BOC Agri Banking Unit මඟින් කෘෂි, පශු සම්පත්, ධීවර ආදී කෘෂිකර්මාන්තයේ සියලුම ක්ෂේත්‍රයන් සවිබල ගැන්වීමට කටයුතු කෙරෙනු ඇත.

වැඩි විස්තර සඳහා
QR කේතය SCAN කරන්න. නැතහොත්
www.boc.lk/m/agri-banking
වෙත පිවිසෙන්න.

SCAN ME

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

# කෞෂාල් රණසිංහ බෝධිචිත්ත හිමි සහ වස්සානයේ යාත්‍රිකයා


**සමහර මිනිසුන්ගේ ජීවිත අපට ජීවිතය ගැන උගන්වන්නේ ඔවුන් කී දේවලින් නොව ඔවුන් ගත් තීරණවලින්. ප්‍රකට සමාජ ක්‍රියාකාරිකයකු වන කෞෂාල් රණසිංහගේ පැවිදි වීමත් එවැනි නිහඬ පාඩමක් අපට කියා දුන්නා. බුදු රජාණන් වහන්සේගේ කාලයේ පවා වැරදි කළ පුද්ගලයන් සුමගට ගත් බව දහමේ අපි කියවලා තියෙනවා. බුදුදහම අපට කියා දෙන්නේ වරදක් කළ මිනිසාටත් යහමග විවෘත බවයි. බෞද්ධ දර්ශනයේ හරය තිබෙන්නේ අතීතයේ නොව වර්තමානය තුළයි. ඕනෑම මිනිසෙකුගේ ජීවිතය වෙනස් කරගත හැකි බවට ඉතිහාසය ශාක්ෂි දරයි. උදාහරණයක් ලෙස සුදින්න හිමියන්ගේ කතා පුවත හඳුන්වා දෙන්න පුළුවන්. මේ හිමියන් ගිහි කල සිටි තමන්ගේ බිරිඳ සමග චීවරයේ සිටිද්දී ලිංගිකව එක්වෙනවා. බුදු හිමියන් ජීවමානව වැඩසිටි කාලයේදීම පාරාජිකා නමින් විනය නීතියක් පැනවූයේ මේ හේතුව නිසයි. වර්තමාන සමාජයේ හැමෝම කියන්නේ තවත් මුදල් හොයන්න, තවත් ජනප්‍රිය වෙන්න, තවත් ඉහළට යන්න කියලයි. ඒත් ඒ සියල්ල මැද මනුෂ්‍යයාට තමන්වම අහිමි වෙන බව දන්නේ කීයෙන් කීදෙනාද?**

අපි ජීවිතය පුරාම අනෙකාගේ ප්‍රශංසාව සතුට වෙනුවෙන් දුවනවා. සමාජය අපි ගැන හොඳ කියන තැනට යන්න වෙහෙසෙනවා. නමුත් රාත්‍රියේ අපි තනියෙන් සිටින විට ඒ ප්‍රශ්නයට පිළිතුරු දිය හැක්කේ අපටම පමණයි. සමහර තීරණ ලෝකයට තේරෙන්නේ නැහැ. ඒ නිසාම ඒවා විවේචනයට ලක්වෙනවා.

සමාජයේ බොහෝ දෙනෙක් තවකෙකුගේ තීරණයක් දුටු විගස එය විනිශ්චය කරනවා. 'ප්‍රශ්නයක් වෙලා ඇති, ජීවිතේ එපාවෙලා ඇති...' කියලා විනිශ්චය කරනවා.

'සෑම තීරණයක් තුළින්ම වේදනාවක් උපදින්නේ නැහැ. මිනිස්සු සමහර තීරණ ගන්නේ ජීවිත අවබෝධය තුළින්මයි...'

අපේ කතානායකයා, කෞෂාල් රණසිංහත් එසේමයි. කෞෂාල් රණසිංහ කලක් ජීවත් වුණේ ප්‍රංශයේ. ඔහු ප්‍රසිද්ධ නර්තන ශිල්පයෙක් වගේම, නීතිඥයෙක් සහ ලේඛකයෙක්. ඔහු විසින් 'මන්දස්මිත' සහ 'යාත්‍රිකයාගේ වස්සානය' යන පොත් රචනා කර තිබෙනවා. ඔහු රැකියාව වශයෙන් කළේ තරුණ සංවිධානයක මානව හිමිකම් උපදේශකයකු වශයෙන් කටයුතු කිරීමයි. කොළඹ විශ්වවිද්‍යාලයේ ලිංගිකත්වය හා සෞඛ්‍යය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් සහ නීතිවේදය හදාරා ඇති කෞෂාල්, ශ්‍රද්ධා රූපවාහිනියේ මාධ්‍යවේදියකු ලෙසද කලක් කටයුතු



කර තිබෙනවා. ජාතික රූපවාහිනියේ නිවේදකයකු ලෙසත් කටයුතු කළ ඔහු සමාජ මාධ්‍යයේ තබා තිබූ සටහනක දැක්වුණේ මෙවැන්නක්.

'මම පැවිදි වුණේ බණ කියන්න. ජීවිතයේ පලායාම වෙනුවෙන් තාවකාලික පැවිද්දක් නෙවෙයි මේ. නැතිනම් කවර හෝ පුද්ගලයකු ගැන කලකිරිලා හෝ වෙනත් කරුණක් මත නෙවේ. මම ගිහි ජීවිතයේ අවසානය වෙනුවෙන් 'යාත්‍රිකයාගේ වස්සානය' ලිව්වෙත් මේ නිසාමයි. ඒ නිසා කවුරුවත් පැවිදි වීම ගැන අපැහැදෙන්න එපා. මගේ මේ තීරණයේ තියෙන්නේ ඉන් එහා ඉලක්කයක්...'

ඔහු තවදුරටත් පවසා සිටියේ,

'කාට හෝ පසුගිය කාලයේ සිත් රිදවීමක් කනස්සල්ලක් මගේ යම් ක්‍රියාවක් වචනයකින් දැන හෝ නොදැන වුණා නම් ඒ ගැන සමාව ඉල්ලමි..' යනුවෙනි. එය ඔහු පැවිදි වීමට පෙර සිය මුහුණු පොතේ තබා තිබූ අවසන් සටහනයි.

සමාජ මාධ්‍ය ඔස්සේ රට තුළ සිදුවන විවිධ සිදුවීම් වෙනුවෙන් හඬනැගූ, අපේ රටේ මෙන්ම ජාත්‍යන්තරයේ පවා ප්‍රසිද්ධියට පත් පුද්ගලයෙක් ලෙසයි කෞෂාල් රණසිංහ හඳුනාගත හැක්කේ. ඔහු, තමන්ගේ අදහස් කිසිම බියක් නැතිව ඉදිරිපත් කර සමාජයේ දැඩි කතාබහකට පාත්‍ර වූ පුද්ගලයෙක්. සමාජ ක්‍රියාකාරිකුව සිටි සමයේ විවිධ මත ගැටුම් කතාබහට ලක්වුණා. ඔහු සමලිංගිකත්වයට පක්ෂව කතාකළා. ඒත් ඔහු දැන් පැවිදි දිවියට පත්වෙලා. ඒ නිසාම වන්නට ඇති සමාජයෙන් සමාව ඉල්ලන්නට ඇත්තේ. ඔහු දැන් ජීවිතය කියන්නේ මොකද්ද කියලා තේරුම් අරන්. පසුගිය 28 වැනිදා ඔහු සියලු දෙනා පුදුමයට පත්කරමින් පූජ්‍ය බෝධිචිත්ත හිමි යන නාමයෙන් පැවිදි දිවියට එළැඹ තිබුණා.

ඔහු තරුණයකු ලෙස ජීවිතයේ අනිත්‍ය තේරුම් අරගෙන අලුත් මාර්ගයක් සොයන්නට වුණා. ඔහු පැවැසුවේ කවමදාවත් කලකිරීමට පත්වෙන්න එපා. බොහෝ දෙනෙක් ජීවිතය එපාවෙලා, 'දැන් ඇති දැන් ජීවිතය හැරයන වෙලාව ඇවිල්ලා' කියලා ආතතියට පත්වෙනවා. එවැනි තරුණ ප්‍රජාව වෙනුවෙන් ඔහු මුහුණු පොතේ සඳහන් කර තිබුණේ 'හිත ශක්තිමත් කරගන්න' යනුවෙනුයි.

ඒ බව ඔහු සිය 'යාත්‍රිකයාගේ වස්සානය' පොතේ පවා සඳහන් කර තියෙනවා. ෆැන්ටසිවලින් එහාට ලෝකයක් ගැන මේ පොතේ විස්තර කරනවා. මිනිස්සු හරි ආසයි නැවත ආත්මයක් ගැන අහන්න. ආරණ්‍යවලට යනවා. විවිධ චරිත ගැන කතා කරනවා. ලිංගික හිංසන ගැන කතා කරනවා. මේ පොතේ පන්සල් ඇතුළේ හිමිවරුන්ගේ ලිංගික ගැටලු, හිංසනය පිළිබඳ කතා කරලා තියෙනවා. සිවුරට වෛර කරන හිමිවරු ඉන්නවා. මේ වගේ මතභේදාත්මක කතාවක් මේ පොත තුළ කියැවෙනවා. මේ පොතේ පෙරවදන ලෙස සඳහන් කරන්නේ 'වසාගත් ආත්ම, සඟවාගත් ආදර කතා, මවාගත් ස්වයං අඳුරු පටල තුළ සිරවී නොසිට හුදෙක් නිවන දැක්වීමට නොව ආලෝකය සහිතව ජීවත්වීම පිණිස සම සරාගය නිබ්බිදාව සහ ආදරණීය නිර්වාණය අරමුණු කරලීමේ වස්සාන සූත්‍රය' යනුවෙනි. ඔහු මේ පොත එළි දක්වන්නට ඇත්තේ පැවිද්ද අරමුණු කරගෙන වන්නට ඇති.



**නිලන්ති රේණුකා**


ඔහු සමාජ මාධ්‍යයේ තවදුරටත් සටහන් කර තිබුණේ මෙවැන්නකි.

'ජීවිතයේ අමාරු මොහොතවල්වලට මුහුණ දෙන, ජීවිතයේ තනිවෙන, ඒ දුක කියාගන්න බැරි ඔබට කියන්නේ... සියලු දේම අනිත්‍යයි නම් ඔබේ දුක සහ කරදරයත් අනිත්‍යයි. ඒ නිසා වෙනස් වෙන දෙයක් ඒ විදිහට දැක මුහුණ දෙන්න. හිත ශක්තිමත් කරගන්න...'

'ඔබේ අනන්‍යතාව මොකක් වුණත්, ඔබ ආදරේ කරන්නෙ කාට වුණත් ඔබ ඔබව මුලින්ම පිළිගන්නවා නම්, ලෝකයෙන් අනුමත බව නොසොයනවා නම්... නූපන් අනාගතය ගැන බිය නොවී, ගිය අතීතය ගැන පසුතැවෙනවා නම්, ඔබට අනිවාර්යයෙන් සතුට උරුමයි...' යනුවෙන් ඔහු ලියා තිබුණේ සියදිවි නසාගන්නා තරුණ තරුණියන්ට ආදර්ශයක් දෙමිනි.

අනුන්ගේ ජීවිත විනිශ්චය කිරීමට පෙර ඔවුන්ගේ ජීවිතවල තිබූ නිහඬ අරගලය ගැන සිතා බලන්න. අද සමාජයට අවශ්‍ය වන්නේ කාටත් වෛර කරන මිනිසුන් හෝ විවේචන නොවේ. අවශ්‍ය වන්නේ එකිනෙකා තේරුම් ගැනීමට හැකි මිනිස්සුයි. වැටුණු කෙනකුට අත දෙන මිනිස්සුයි. අඬන කෙනකුගේ කඳුළක් පිසදමන්න පුළුවන් මිනිස්සුයි. ජීවිතයේ ලොකුම ජයග්‍රහණය වන්නේ අන් අය පරාජය කිරීම නොවෙයි, තමන්ගේ ලෝභය ඊර්ෂ්‍යාව සහ අහංකාරය පරාජය කිරීමයි. ඒ ජයග්‍රහණය ලබාගත් මනුෂ්‍යයාට ඔහු දිනුවත් නොදිනුවත් ජයග්‍රාහයකයෙක්ම පමණයි... ඒ බව ඔහු අපට වටහා දුන්නා.

අපි හැමෝම දවසක මේ ලෝකෙන් නික්ම යනවා. අපි රැගෙන යන්නේ මුදල්, බලය හෝ ජනප්‍රියත්වය නොවේ. කළ හොඳ සහ නරක විතරයි. අපේ හිත්වල නිර්මල බව විතරයි. ඒ නිසා ජීවිතය තරගයක් කර නොගන්න. කෙනකුට රිදවීමට පෙර දෙවරක් හිතන්න. සමාව ඉල්ලීමට ප්‍රමාද නොවන්න. සමාව දීමටත් පසුබට නොවන්න. අපි හැමෝම මේ ලෝකයේ නවාතැන් ගත් යාත්‍රිකයන් පමණයි. ඒ නිසා යන ගමනේදී වෛරය නොව ආදරයත්, විනිශ්චය නොව අවබෝධයත්, අහංකාරය නොව නිහතමානීත්වයත් ඉතිරි කර යමු. එවිට අපි ජීවත් වුණේ අර්ථවත් ලෙසය යන සැනසීම අපේ හිත්වලට දැනෙයි. සසර ගමන ජයගන්නට බෝධිචිත්ත හිමියන්ට අවශ්‍ය කායික මානසික ශක්තිය හා ධෛර්යය උන්වහන්සේට ලැබේවායි අපි හදවතින්ම ආශීර්වාද කරමු...



PAGE - 01

## යෝෂිතට වරදියි...

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ තමන්ට එරෙහිව නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණය හමුවේ ගොනුකර තිබෙන නඩුවේ අන්තර්ගත 'කුමන්ත්‍රණය' නමැති චෝදනාව පවත්වාගෙන යාමට නොහැකි බවට තීන්දුවක් ලබාදෙන ලෙස ඉල්ලා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පුත් යෝෂිත රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කළ ප්‍රතිශෝධන පෙත්සම අභියාචනාධිකරණය නිෂ්ප්‍රභ කළේය.

එම කරුණ අභියෝගයට ලක්කරමින් යෝෂිත රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කළ ප්‍රතිශෝධන පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව එහි තීන්දුව දෙමින් අමල් රණරාජා සහ ආචාර්ය සුමුදු ප්‍රේමචන්ද්‍ර යන මහත්වරුන්ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල විසින් මෙම තීන්දුව ලබාදුණි.

## ජනාධිපති පුතෙක්...

හිටපු ජනපතිවරයකුගේ පුත්‍රයකු විසින් රේගු බදු වංචා කරමින් රුපියල් කෝටි ගණනක් වටිනා සුඛෝපභෝගී මෝටර් රථ මෙරටට හොර රහසේ රැගෙන ආ ජාවාරමක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ විමර්ශනයක් ආරම්භ කර ඇති බව වාර්තා වේ.

මෙම ජාවාරම ක්‍රියාත්මක වී ඇත්තේ පසුගිය ආණ්ඩු කාලවලදීය. කන්ටේනර්වල සඟවා සංවිධානාත්මක ලෙස මෙරටට රැගෙන ආ වාහන කිහිපයක් ගැන තොරතුරුද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනාවරණ කරගෙන ඇත.

එම වාහනද පරිහරණය කරනු ඇතැයි පෙනීගොස් ඇත්තේ දේශපාලනයට සම්බන්ධ අයගේ දරුවන්ය. ඒ සම්බන්ධයෙන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ වනවිට කරුණු සොයාබලමින් පවතී.

හිටපු ජනාධිපතිවරයාගේ පුතා විසින් එසේ කන්ටේනර්වලින් පන්නා මෙරටට රැගෙන ආ වාහන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දූෂිත නිලධාරින්ගේ සහායෙන් ලියාපදිංචි කර ඇති බවද විමර්ශනවලින් පෙනීගොස් ඇත.

එසේ හොර පාරෙන් ආ වාහනයක් ගැන විමර්ශන පැවැත්වීමේදී එම වාහනයේ ලියාපදිංචි හිමිකරු බව පැවසෙන දේශපාලනඥයෙකුගේ පුතෙකු ලියාපදිංචි වාහනයට රේගු බදු ගෙවා ඇති බව ද පෙනී ගොස් තිබේ.

එවැනි වාහන රාජසන්තක කරනවා වෙනුවට බදු ගෙවීමට අවස්ථාව ලබාදීමක් ගැනද තොරතුරු අනාවරණය වී ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළ විමර්ශනයකදී තවත් එවැනිම වාහනයක් අත්අඩංගුවට ගෙන තිබේ. එම වාහනය අත්අඩංගුවට ගෙන ඇත්තේ ආණ්ඩු පෙරළියට ටික කලකට පෙරය. එහිදී එම වාහනය භාරව සිටි පුද්ගලයා එය ජනපති පුතෙකුට අයත් එකක් බව පවසා ඇති බවද සඳහන්ය.

එම වාහනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුවට භාරදී ඇති බවත් වත්මන් ආණ්ඩුව බලයට ඒම හේතුවෙන් එම වාහනයටද බදු ගෙවා නිදහස් කර ගැනීමට හැකිවී නැති බව සඳහන්ය.

එය තවදුරටත් රේගු භාරයේ ඇති බවත් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට ඉදිරි සතිය තුළ හිටපු ජනපති පුතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්වීමට නියමිත බවත් පොලිස් ආරංචි මාර්ග සඳහන් කළේය.

## ඇමැතිලත් වරද්දා ගනී...

කිරීමට රට පුරා පිහිටි ගොවි සංවිධාන නියෝජිතයන් තීරණය කර ඇත.

ඒ අනුව කෘෂිකර්ම අමාත්‍ය කේ.ඩී. ලාල්කාන්ත, කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න සහ සෞඛ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතාට එරෙහිව මෙසේ රට පුරා විරෝධතා ව්‍යාපාර සංවිධානය කිරීමට ගොවි සංවිධාන තීරණය කර තිබේ.

මෙහිදී පළමුව ගොවීන් සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කරමින් කෘෂිකර්ම අමාත්‍ය කේ.ඩී. ලාල්කාන්ත මහතා සඳහන් කර සිටියේ මඩ සෝදාගත් කල ගොවියන් රජකමට සුදුසු බවට ඇති සඳහන පැරණි එකක් බවත්, එය වර්තමානයට නොගැළපෙන බවත්ය.

රටේ ජනතාව කන්නේ බොන්නේ ගොවීන් නිසා වන බවට වූ මතය වැරැදි බව කී අමාත්‍යවරයා ගොවීන්ද එය දැනගත යුතු බවත්, ගොවියන් රජවරුන් යැයි කීවේ ඉස්සර බවත් අවධාරණය කර සිටියේය.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරමින් අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා කියා සිටියේ මඩ සෝදාගත් කල ගොවියන් රජකමට සුදුසු යැයි කියා තිබුණේ උඩුනුවර සහ යටිනුවර ගොවීන් සම්බන්ධයෙන් යැයි කියාය.

ඒ අනුව පසුගිය සිකුරාදා වනවිට ඇමැතිවරුන්ගේ මෙම ප්‍රකාශවලට එරෙහිව රට පුරා ගොවි සංවිධාන උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ කිරීමට පියවර ගෙන තිබිණි.

## ගොවි කැරැල්ලක්...

මෙවර වී වගාවට සහතික මිලක් ලබාදෙන ලෙස ඉල්ලමින් රට පුරා සිටින ගොවි ජනතාව ආණ්ඩුවට දැඩි බලපෑමක් එල්ල කිරීම ආරම්භ කොට තිබේ.

ඒ අනුව ඔවුන් පෙන්වා දෙන්නේ පවතින වියදම්වලට අනුරූපීව සහ ආණ්ඩුව මැතිවරණ සමයේදී ප්‍රකාශ කළ පරිදි රුපියල් 150ක සහතික මිලක් වී කිලෝවකට ලබාදෙන ලෙසටය.

කෙසේ වෙතත් ආණ්ඩුව මේ වනවිට සහතික වී මිල ලෙස ප්‍රකාශ කොට ඇත්තේ රුපියල් 120කි. නමුත් ගොවීන් සඳහන් කර සිටින්නේ ආණ්ඩුව එසේ කියා සිටියද වී කිලෝවක මිල රුපියල් 80-90 දක්වා පහත වැටී ඇති බවකි.

මේ නිසා වහාම සාධාරණ මිලකට තමන්ගේ වී ආණ්ඩුව විසින් මිලදී ගතයුතු බවත්, එසේ නොමැති නම් ඊට එරෙහිව දැවැන්ත සටනක් ආරම්භ කිරීමට සූදානම් බවත් ගොවි සංවිධාන නියෝජිතයෝ සඳහන් කර සිටිති.

මෙහි ආරම්භයක් ලෙස පසුගිය සිකුරාදා දිනයේදී රඹෑවේ ගොවි ජනතාව දහස් ගණනින් පාරට බැස A9 මාර්ගය අවහිර කරමින් දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාරයක නිරත වීමට පියවර ගත්හ.

## හදිසි දුරකතන...

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අතර විශේෂ දුරකතන සාකච්ඡාවක් පසුගිය සතියේ සිදුව තිබේ.

පසුගිය සතියේ ජනාධිපති කාර්යාලයේ පැවැති ජාතික ආපදා කළමනාකරණ කමිටු රැස්වීමට පෙරාතුව මෙම දුරකතන සාකච්ඡාව පැවැත්වී ඇති බව දැනග න්නට තිබේ.

එහිදී ජනාධිපතිවරයාට පළමුව ඇමතුම ගෙන ඇති විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා, ජාතික ආපදා කළමනාකරණ කමිටුවේදී තමන්ට පළමුව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදෙන ලෙසට ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කොට ඇත.

සිය නිවසේ දානමය පින්කමක් පැවැත්වෙන බැවින් ඊට සහභාගි වීමට අවශ්‍ය වේලාව ලබාගැනීම සඳහා මෙසේ රැස්වීමේ පළමු කතාව තමන්ට ලබාදෙන ලෙස විපක්ෂ නායකවරයා ජනාධිපතිවරයාගෙන් ඉල්ලා තිබේ.

ඒ අනුව ජනාධිපතිවරයාද ඊට යහපත් ප්‍රතිචාරයක් දක්වමින් රැස්වීමේදී පළමුව අදහස් දැක්වීමේ අවස්ථාව විපක්ෂ නායකවරයාට ලබාදීමට එකඟතාව පළකොට ඇත.

## ඩබල් ගේමක...

රටේ දිගුකාලීන පැවැත්ම තීරණය කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ දේශපාලන හේතු මත ප්‍රමාද නොකරන්නැයි ඔවුන් රජයට දැඩි ලෙස බලකර සිටී.

කොළඹ පැවැති සතියක සමාලෝචන මෙහෙයුමකින් පසු IMF මෙහෙයුම් ප්‍රධානී එවන් පැපජියු මහතා පෙන්වා දෙන්නේ මතුපිටින් පෙනෙන යථා තත්ත්වයට පත්වීමට යටින් තවමත් බරපතළ අවදානම් පවතින බවයි.

මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

## සජබ පෙරට...

වී මිල විශාල ලෙස පහත වැටීම හේතුකොට ගෙන අන්ත අසරණභාවයට පත්ව සිටින ගොවි ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් දියත් කිරීමට සමගි ජන බලවේගය තීරණය කොට තිබේ.

පසුගිය සිකුරාදා පැවැති එම පක්ෂයේ කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම තීන්දුව ගෙන ඇති බව දැනගන්නට ඇත.

එහිදී ආණ්ඩුව විසින් සාධාරණ මිලක් වීවලට ලබාදීමට පියවර නොගැනීම සහ ආණ්ඩුවේ ප්‍රධානීන් විසින් ගොවි ජනතාව අපහසුතාවට පත්කරමින් සිදුකරන ප්‍රකාශවලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ගයක් ගත යුතු බවට සජබ කළමනාකරණ කමිටුවේදී මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දී ඇත.

ඒ අනුව රට පුරා ගොවීන් විසින් ආරම්භ කර ඇති උද්ඝෝෂණ ව්‍යාපාරවලට සහාය දැක්වීමටත්, ගොවීන්ගේ වීවලට සහතික මිලක් ලබාදෙන ලෙස ඉල්ලා උද්ඝෝෂණ ව්‍යාපාර සංවිධාන කිරීමටත් සමගි ජන බලවේගය තීරණය කොට ඇති බව දැනගන්නට තිබේ.

## ශ්‍රී ලංකා ටෙනිස් ප්‍රිමියර් ලීගය නිල වශයෙන් එළිදැක්වේ

ශ්‍රී ලංකා ටෙනිස් සංගමය (SLTA) විසින් Cinnamon Life හෝටලයේ The Studioහිදී ශ්‍රී ලංකා ටෙනිස් ප්‍රිමියර් ලීගය (SLTPL) නිල වශයෙන් එළිදක්වන ලදී. වෘත්තීය ලීග් කළමනාකරණය, ආයතනික හවුල්කාරීත්වය සහ නවීන තාක්ෂණය මත පදනම් වූ තරග සංවිධාන ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාවේ ටෙනිස් ක්‍රීඩාව නව මට්ටමකට රැගෙන යාම මෙම ලීගයේ ප්‍රධාන අරමුණ වේ.

මෙම සමාරම්භක අවස්ථාවට ශ්‍රී ලංකා ටෙනිස් සංගමයේ සභාපති ඉක්බාල් බින් ඉසාක්, උප සභාපති රුක්මල් කුරේ, SLTPL අධ්‍යක්ෂ රොෂාන් සිල්වා සහ මෙහෙයුම් කමිටු සාමාජිකයන් වන ආසිරි ඉද්දමල්ගොඩ, සංජය



විජේමාන්න සහ අර්ජුන් ප්‍රනාන්දු ඇතුළු ක්‍රීඩා ක්ෂේත්‍රයේ සහ ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රමුඛයන් රැසක් එක්ව සිටියහ. එමෙන්ම, අනාගත ෆ්‍රැන්චයිස් හිමිකරුවන්, අනුග්‍රාහකයන් සහ උපායමාර්ගික හවුල්කරුවන්ගේ සහභාගීත්වයද මෙම ලීගය පිළිබඳ ඉහළ වාණිජ සහ ක්‍රීඩාමය උනන්දුවක් පවතින බව පිළිබිඹු කළේය.

SLTPL හි මංගල තරගාවලිය 2026 අගෝස්තු 27 සිට 30 දක්වා පැවැත්වීමට නියමිත අතර, ෆ්‍රැන්චයිස් කණ්ඩායම් අටක් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ දක්ෂතම ටෙනිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විවිධ වයස් කාණ්ඩ යටතේ තරග වැදීමට නියමිතය.

තරගාවලියක් පමණක් නොව, ටෙනිස් ක්‍රීඩාව සඳහා තිරසාර වාණිජ වටිනාකමක් නිර්මාණය කරමින් ක්‍රීඩකයන්ට, ෆ්‍රැන්චයිස් හිමිකරුවන්ට, අනුග්‍රාහකයන්ට සහ ප්‍රේක්ෂකයන්ට ඉහළ මට්ටමේ අත්දැකීමක් ලබාදීම අරමුණු කරගත් දිගුකාලීන ක්‍රීඩා වේදිකාවක් ලෙස SLTPL සැලසුම් කර ඇත.

ප්‍රියන්ත හෙට්ටිගේ

## හාන්දා ශ්‍රීගේ කැබිනෙට්ටුව

### කළු කී කතා අද අමතක කරනු එපා

මොකටද සාහිතය ඇයි කන්ඩද මන්දා
විමසූ එදා සිටි පාලකයන් හින්දා
ඉවසුම සංවේදිකම මියගිය හන්දා
මතකද අපේ රට අපමණ දුක වින්දා

සරසවිවල පවා ඉවසුම නැති වීමෙන්
පාලනෙ බිඳවැටුණි දැඩි ලෙස පිරිහීමෙන්
සෙනෙහස ආදරය එලෙසට වැනසීමෙන්
රට පිරිහුණා සුදිලුණු දෑ අභිමානෙන්

සාහිතෙ රැක ගැනුම උදෙසා පෙරට ඇදී
සපැමිණි සරච්චන්දර වැනි රටට ළැදී
උගතුන් කානුවල ඔබ ඔබ කසළ රැඳී
කළු පැල්ලමක් ඉතිහාසයෙ තබන ලදී

එවැනිවු දෙයකටද වත්මන සැරසෙන්නේ
ඉතිහසෙ වසා දැමුමට ඇයි දඟලන්නේ
බොදු බිම මුඬු බිමක් කෙරුමට පොරකන්නේ
පරගැති අරමුණකි මේ ඉටු කරවන්නේ

කතිරය ලබනු වස් ජනයට සිනහ පපා
කළු කී කතා අද අමතක කරනු එපා
ඉටු කරලනු එපා පරගැතියනගෙ උපා
'දම්දිව' නසන පරගති සිහ රටට එපා

# මඩ ගා ගත්තා ය කියා රජා ගොවියා වන්නේ නැත!

**අපි මේ හදලා තියෙන්නේ පොඩි මිනිස්සුන්ගේ ආණ්ඩුවක්. ආණ්ඩුවේ තනතුරු දරන්නෙත් පොඩි මිනිස්සු. ඒගොල්ලන්ගේ කොලිටි එකත් මේ පොඩි මිනිස්සු නියෝජනය කරන්න දන්න එක. පොඩි මිනිස්සුන්ගේ දුක, වේදනාව, ප්‍රශ්න මේ ඔක්කොම මේගොල්ලෝ දන්නවා. ඉතින් ඒ නිසාම පොඩි මිනිස්සුන්ට මේ ආණ්ඩුවත් එක්ක වැඩ කරන්න හරි පහසුයි. ඇත්තටම කාලයක් මේ රටේ දේශපාලනය කළේ පොඩි මිනිස්සුන්ගේ දුක නොදන්න අයනේ. ඕක තමයි අපිට තිබුණු තර්කය. ඒත් දැන් නෝනාවරුනි මහත්වරුනි, මේ ප්‍රශ්නය උඩුයටිකුරු වෙලා කියලා අපිට හිතෙනවා. මේවා මේ අපි කිව්වට කවුරුවත් පිළිගන්න එපා. මොකද ඒකට හේතුව ඔයාට ඕනෙ තරම් අවස්ථාව තියෙනවා අපිව විශ්වාස කරනවද නැද්ද කියන එක තීරණය කරන්න. ඒත් අපි නිකන් මෙහෙම කියන්නේ හිතේ හුරුවට. අපිට දැනෙන දේවල්වලට අපිට පේන දේවල්වලින් තමයි අපි මෙහෙම කියන්නේ.**

ලංකාවේ කවුරු කොහොම කිව්වත් මේ දේශපාලන වෙනස සිද්ධ කරන්න ගොවියා, එහෙම නැත්නම් සාමාන්‍ය මිනිහා පදනම් වුණා. අපි ගොවියා කියලා කිව්වම ඒගොල්ලන්ට කියන්නේ 'මඩ සෝදාගත් කල ගොවියා රජකමටත් සුදුසුයි' කියලා. ඇත්තටම එහෙම කියන එකට හොඳම උදාහරණය තමයි මේ වෙලාවේ ලංකාවේ ජනාධිපතිවරයා. ඒගොල්ලන්ට කුඹුරු තියෙනවා. ඒගොල්ලෝ ගොවිතැන් කරනවා. ඒගොල්ලෝ ගොවි ගම්මානවල. ඒගොල්ලන්ට ගොවියෙක් විදිහට ජීවත් වෙන මිනිහෙක්ගේ හෘද සාක්ෂිය පිළිබඳ යම් දැනුමක් තියෙනවා.

මොකද කොළඹ ඉපදිච්ච රනිල්ටවත්, හම්බන්තොට මුල නොවෙච්ච, හම්බන්තොට ජීවිතයට කිසිම වගකීමක් අයිතිවාසිකමක් නැති සජිත්ටවත්, ඊළඟට එහෙම්ම හම්බන්තොට හයිකාරයෙක් විදිහට වැඩ කටයුතු කරගෙන ඉන්න මහින්ද රාජපක්ෂටත් වඩා, ගොවිතැන ගැන කෘෂිකර්මය ගැන සාමාන්‍ය මිනිස්සුන්ගේ හෘද සාක්ෂිය ගැන අවබෝධයක් තියෙන්නේ මේ අනුර කුමාර දිසානායක වගේ අයට.

එහෙම පිලක ලාල්කාන්ත මහත්තයා වගේ කට්ටියගේ සමහර ප්‍රකාශ දැක්කම චුට්ටක් ඇඟ හිරිවැටෙනවා. දැන් මේගොල්ලෝ කියන්නේ ගොවියාට ඒ 'මඩ සෝදාගත් කළ රජකමටයි සුදුසු' කියන කතාව දැන් පරණ කතාවක් කියලා. ඒ අස්සේ එක මහත්තයෙක් කියනවා කටේ දිවේ නොගෑවී මේ ගොවියෝ නෙමෙයි කසිප්පුකාරයෝ කියලා.

දැන් ඇත්තටම ලංකාවේ ගොවියා කසිප්පුකාරයාගේ ලෙවල් එකට දාලා, ඔය කසිප්පුකාරයෝ කියන කතා ගණන් ගන්න එපා කියලා ගොවියාගේ ප්‍රශ්න අමතක කරලා දාන ලෙවල් එකට මේ රට එනවා කියලා කියන්නේ මරු. එහෙම එක එක කයිකතන්දර අපි දැක්කා එක එක්කෙනා කියනවා. මේ කසිප්පු කතාවට නම් අපි දැක්කා මේගොල්ලෝ උත්තරත් දීලා තිබුණා.

සමහරු කියනවා දැන් මේ කතාකරන්නේ ගොවියෝ නෙමෙයි, මේ කතාකරන්නේ ගොවියන්ගේ වෙස්වළාගත්තු ආර්ටිෆිෂල් කට්ටිය, ඒගොල්ලන්ට ගොවිතැන සම්බන්ධ ප්‍රශ්නයක් නැහැ කියලා. ඉතින් දැන් ගොවියන්ගේ ප්‍රශ්න කතාකරන්න ගියාට පස්සේ ඒ මිනිස්සුන්ට එක එක දේවල් අහගන්න වෙලා. ඇත්තටම රටකට ගොවියා කොච්චර වැදගත්ද කියන එක කියලා තමයි මේගොල්ලෝ බලයටත් ආවේ. අන්තිමට ගොවියාට යන එන මං නැතිවෙලා. ඕක තමයි ඇත්ත තත්ත්වය.

ඒ අස්සේ මේ ආණ්ඩුව, මෙහෙම කිව්වට තරහ වෙන්න එපා, ඔයාලා ගොඩක් කට්ටියගේ අමාරුව හොඳ කළා කියලා නම් අපිට දැන් තේරෙනවා. ගුරුවරුන්ගේ අමාරුව හොඳ කළා. ගුරුවරුන්ට දැන් ආයේ ප්‍රශ්න කරන්න විදිහක් නැහැ. ගුරුවරයාට ළමයෙක් ඔළුව තියාගෙන ඉන්නවා දැකලා උට ඔළුව උස්සන්න කියන්නවත් බැරි විදිහට ඒගොල්ලන්ගේ අමාරුව හොඳ කළා. බොහෝ ක්ෂේත්‍රවල අමාරුව හොඳ කරලා අලුත් දේශපාලන ප්‍රවාහයක් හදලා දුන්නා. දැන් එක එක්කෙනාගේ නම් ගම් කියලා අර ක්ෂේත්‍රය මේ ක්ෂේත්‍රය කියලා කියන්න අවශ්‍ය නැහැ. කොහොමත් අපිට එකපාරම කියන්න පුළුවන් වෙන කාරණය තමයි 'අමාරුව හොඳ කළා' කියන එක. ඒ වගේම උසස් පෙළ ළමයින්ගෙත් අමාරුව මට පේන්නේ හොඳ වෙයි වගේ. රැල්ලට ඡන්දෙ දුන්නු කට්ටියට මේ වැඩෙන් පස්සේ තේරෙන්න ඉඩ තියෙනවා මේ ආණ්ඩුව නම් ලේසි නැහැ කියන එක.


ඇත්තටම අපි මේ කියන්නේ නරකයිම කියන එක නෙමෙයි. සමහර තීන්දු තියෙනවා, සමහර තීරණ තියෙනවා ගතයුතු. සමහර තීරණ තියෙනවා නොගත යුතු. ගතයුතු තීරණ සහ නොගත යුතු තීරණ අතර තියෙන ගැටුම තමයි අපි දකින්නේ.

මේ වෙලාවේ ගොවියාට හොඳවයින් දෙකක් කියන්නෙත් කෘෂිකර්ම ඇමැතිලා, කෘෂිකර්මයට සම්බන්ධ වෙලා ඉන්න කට්ටිය. ඒ කාලේ මේගොල්ලෝ ගොයම් කැවා. මේ ගොවියාගේ ප්‍රශ්න දැකලා වේදනාව දරාගන්න බැරුව ඉවසාගන්න බැරුව ගිය තැන කුඹුරුවලට ගිහිල්ලා ඇඬුවා. හැබැයි කුඹුරුවලට ගිහිල්ලා ඇඬුවට පස්සේ අපේ කුඹුරුවල හිටපු ගොවියෝ මොකද කළේ? අනේ මඩ හෝදාගෙන එළියට බැහැලා ඡන්දෙ දුන්නා. දැන් අද පෝර ටික නැහැ, අද කුඹුරු ටික අස්වද්දගන්න විදිහක් නැහැ, වී ටිකට මිලක් නැහැ. මේ වගේ එක එක ප්‍රශ්න නිර්මාණය වෙලා තියෙනවා.

ඉතින් ඒ නිසා අපි කිසි වෙලාවක කියන්නේ නැහැ මේ මොහොත ලංකාවේ දේශපාලනයේ තියෙන නරකම මොහොත කියලා. අපි කියන්නේ නැහැ මේ ක්‍රමය හොඳ නැහැ කියලා. හැබැයි අපිට එක දෙයක් තේරෙනවා මේගොල්ලෝ මිනිස්සුන්ව නම් තඹේකට මායිම් නොකරන බව. මිනිස්සුන්ව තඹේකට මායිම් නොකර සමහර ප්‍රකාශ නිකුත් කරන බව.

මේ ආණ්ඩුවේ ඉන්න මහපොළොව ගැන තේරෙන දේශපාලකයන්ගෙන් එක්කෙනෙක් තමයි ලාල්කාන්ත. ලාල්කාන්තගේ නරක වැඩ ගැන විවිධ චෝදනා එල්ල වෙලා තිබුණා. හැබැයි ඒ මිනිස්සු කරන වැරදි. මිනිස්සු කරන වැරැදි නොකරන දේශපාලකයෝ ඉතාම භයානකයි. ඒකට හේතුව මිනිස්සු නොකරන වැරදි කරන දේශපාලකයොනේ වැඩියෙන් ඉන්නේ. ඒ නිසා ලාල්කාන්ත වගේ මහපොළොවේ දේශපාලනය තේරෙන, මහපොළොවේ ජීවත්වෙන, සාමාන්‍ය මිනිස්සුන්ගේ හෘද සාක්ෂිය පිළිබඳ අවබෝධයක් තියෙන, මේ ආණ්ඩුවේ ඉන්න හොඳම සාමාන්‍ය මිනිහත් මේ විදිහේ ප්‍රකාශ කරනවා නම් මේ ආණ්ඩුව ගැන අපිට දැනෙන්නේ බයක්. ඒ බය බොහොම නරකයි. ඒකට හේතුව කවදා කොහොම මේ ක්‍රමය නිමා වෙයිද කියලා හිතාගන්න බැරි තත්ත්වයක් තමයි මේ රටේ නිර්මාණය වෙලා තියෙන්නේ.

රටකට ඕනේ සාමාන්‍ය මිනිස්සුත් එක්ක ගනුදෙනු කරන්න දන්න දේශපාලකයෝ. සාමාන්‍ය මිනිස්සුත් එක්ක ගනුදෙනු කරන්න දන්නවා කියන එකෙන් අදහස් කරන්නේ සාමාන්‍ය මිනිස්සුන්ව රවට්ටනවා කියන එක නෙමෙයි. අපි දැක්කේ පහුගිය කාලෙම මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ව රවට්ටන දේශපාලනයක්. දැන් සාමාන්‍ය මිනිස්සු රවට්ටන දේශපාලනයක් වෙනුවට සාමාන්‍ය මිනිස්සුත් එක්ක සුහදව කටයුතු කරන්න පුළුවන් දේශපාලන ක්‍රමයක් නිර්මාණය වෙලා, මිනිස්සු එහෙම කණ්ඩායමක් බලයට ගෙනල්ලා අවසාන වතාවේ බලාපොරොත්තු වුණු දේ තමයි දැන් හරියයි කියලා. හැබැයි දැන් අපිට තේරෙනවා ඒත් හරියන්නේ නැහැ කියලා. ඇත්තටම අපිට විකල්පයක් තියෙනවද? ඕක තමයි ඉතිරි වෙච්ච ප්‍රශ්නය. බලාගෙන ඉන්නවා ඇරෙන්න වෙන කරන්න කිසි දෙයක් නැහැ.



ජීවන පහන් තිළිණ



---



# ඉන්දියාව ඇමෙරිකාව චීනය ඉද්දී කොළඹ වරායට ප්‍රංශය එන්නේ ඇයි?

**ලංකාවේ ප්‍රංශ තානාපති Remi Lambert ඉතිහාසය සහ භූගෝලය පිළිබඳ උපාධිධාරියෙකි. ඔහු ප්‍රංශ අධිරාජ්‍යයා නැපෝලියන් බොනපාට් ලංකාවේ ත්‍රිකුණාමල වරායේ උපායමාර්ගික වටිනාකම ගැන කළ ප්‍රකාශය දන්නවා විය හැකිය. ත්‍රිකුණාමලය පාලනය කරන්නේ කවුද, ඔහු ඉන්දිය සාගරයම පාලනය කරනවා යැයි නැපෝලියන් බොනපාට් ප්‍රකාශ කළේය. හේතුව නැපෝලිනික් යුද්ධයේදී මේ ස්වභාවික වරාය ප්‍රධාන රාජකීය නාවික හමුදා මර්මස්ථානයක් විය.**

නැපෝලිනික් යුද්ධයට කලින් මෙම කලාපය ඇමෙරිකානු විප්ලවීය යුද්ධයේදී ප්‍රධාන වේදිකාවක් විය. 1782 'බැටල් ඔෆ් ට්‍රින්කොමලි' හිදී ප්‍රංශ අද්මිරාල් Bailli de Suffren බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව සමග ද්වන්ධ සටනක් කළේය. තාවකාලිකව ප්‍රංශය ත්‍රිකුණාමල වරාය අත්පත් කරගත් අතර, ප්‍රංශයේ ඉන්දීය සන්ධානයට සැපයුම් මර්මස්ථානයක් ලෙස වරාය ප්‍රයෝජනයට ගැනුණි.

නැපෝලියන්ට පසු ඉන්දියානු සාගරයේ ලංකාවේ භූ දේශපාලන වටිනාකම අවබෝධ කරගත්තේ වත්මන් ප්‍රංශ ජනාධිපති මැක්රොන්ය. ලංකාව බංකොලොත් වූ පසු අයි.එම්.එෆ්. ගිවිසුම සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය වූ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට ප්‍රංශ ජනාධිපති මැදිහත් විය. ඒ, පැරිස් ක්ලබ්හි ණය ප්‍රතිව්‍යුහගත කිරීමටය. ප්‍රංශ ජනාධිපතිවරයා එවක ලංකාවේ ජනාධිපති රනිල්ට ප්‍රංශයේ නව විශ්වීය මූල්‍ය ගිවිසුම් සමුළුවට ආරාධනා කළේය. එසේම ඔහු ලංකාවේ හුවමාරු මධ්‍යස්ථානයක් කොට ජනාධිපති රනිල් සමග ද්විපාර්ශ්වික සබඳතා සහ නාවික ආරක්ෂාව ගැන සාකච්ඡාවක්ද කළේය. ඉන් පසු පසුගිය වසරේදී ඉන්දියානු සාගරයේ රඳවා ඇති ප්‍රංශ හමුදාවේ ඒකාබද්ධ අණදෙන නිලධාරි, රියර් අද්මිරාල් Hugues Lainé ලංකාවට පැමිණ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු ඉහළ පෙළේ නිලධාරීන් හමුවිය. රියර් අද්මිරාල්වරයා ලංකාවේ භූගෝලීය පිහිටීම සහ නාවික ආරක්ෂාව සඳහා අනාගත සබඳතාවයේ වැදගත්කම පෙන්වා දුන්නේය. ඇමෙරිකානු පැසිෆික් එයාර්ෆෝස් කමාන්ඩර් ලංකාවට පැමිණ සිටියදී මෙරට ප්‍රංශ තානාපති විදේශ ඇමැති විජිත හේරත් හමුවූයේ පසුගිය සතියේය. එහිදී ඔහු කොළඹ වරායේ නැගෙනහිර ජැටියේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම සඳහා ප්‍රංශ ආයෝජකයන් කැමැත්තෙන් සිටින බව දැනුම් දුන්නේය. ඉන් පසු ප්‍රංශ තානාපතිවරයා වරාය ඇමැති අනුර කරුණාතිලක සහ වරාය සභාපති හමුවිය. තානාපතිවරයා වරාය ඇමැති හමුවූයේ ප්‍රධාන පෙළේ ප්‍රංශ ආයෝජකයන් පිරිසක් සමගය. එම දූත පිරිසට නායකත්වය දුන්නේ ලෝ ප්‍රකට ප්‍රංශ සමුද්‍රික යාත්‍රා සමාගමක් වන CMA-CGM විධායක උපසභාපතිනියය. CMA-CGM සමාගම ප්‍රධාන පෙළේ පර්යන්ත මෙහෙයුම් සමාගමක් වන අතර, ලොව ප්‍රධාන වරායවල බහාලුම් පර්යන්ත 65ක මෙම සමාගම මෙහෙයුම් දියත් කරයි. කොළඹ වරායේ උපායික භූගෝලීය පිහිටීම අනුව කොළඹ වරාය වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ සමාගමක් හරහා දායක වෙන්න ඔවුන්ගේ කැමැත්ත උපසභාපතිනිය ප්‍රකාශ කළාය. ඇය වැඩිදුරටත් පෙන්වා දුන්නේ CMA-CGM සමාගම දැනටමත් කොළඹ වරායේ බටහිර ජැටියේ දෙවැනි අදියර ව්‍යාපෘතිය අධ්‍යයනය කරමින් සිටින බවය. ජූලි මස 16 ලංකාවේ ජනාධිපති අනුර ප්‍රංශයේ සංචාරය කිරීමට නියමිත බව ප්‍රංශ තානාපති ප්‍රකාශ කළේ එම සාකච්ඡාවේදීය. ප්‍රංශයේදී ජනාධිපතිවරයා CMA-CGM උපසභාපති හමුවීමට නියමිත බවද ඔහු පැවැසීය.

ලංකාවේ භූ දේශපාලන දාම් ලැල්ලේ ප්‍රංශ ඉත්තාගේ පැමිණීම ඇමෙරිකාව, ඉන්දියාව සහ චීනය කොහොම කියවයිද කියන්න දන්නේ නැත.



---

**දකුණු ඉන්දියාවේ දේශපාලනය නැවතත් උණුසුම් වී තිබේ. සිනමා තරුවක සිට දේශපාලන නායකයකු බවට පත්ව තමිල්නාඩුවේ බලයට පත්වූ ජෝසෆ් විජේගේ නායකත්වයෙන් යුත් තමිලග වෙට්‍රි කසාගම් ආණ්ඩුව පෙරළා දැමීම සඳහා මන්ත්‍රීවරුන් මිලදී ගැනීමේ උත්සාහයක් සිදුවූ බවට එල්ලවී ඇති චෝදනා හේතුවෙන් ප්‍රාන්ත දේශපාලනයේ දැවැන්ත අර්බුදයක් නිර්මාණය වී තිබේ.**

මෙම සිද්ධිය හුදෙක් අල්ලස් චෝදනාවක් පමණක් නොවේ. එය තමිල්නාඩුවේ නව දේශපාලන බල තුලනය, විපක්ෂයේ උපාය මාර්ග සහ ඉන්දියානු ප්‍රාන්ත දේශපාලනයේ බහුලව කතාබහට ලක්වන "Horse Trading" හෙවත් මන්ත්‍රී දේශපාලනය පිළිබඳ නැවතත් ජාතික අවධානය යොමු කළ සිද්ධියක් බවට පත්ව ඇත.

## කතාව ආරම්භ වූයේ කෙසේද?

ටී.වී.කේ. මන්ත්‍රී එන්. ඉලෙයිරාජා මහතා චෙන්නායි පොලිසියට කළ නිල පැමිණිල්ලේ සඳහන් වූයේ කතානායකවරයාට එරෙහි යෝජනාවකදී තමන්ගේ ඡන්දය වෙනස් කරවා ගැනීම සඳහා ඉන්දීය රුපියල් කෝටි 35ක (රුපියල් මිලියන 350ක) අල්ලසක් පිරිනැමීමට උත්සාහ කළ බවයි.

පැමිණිල්ලෙන් පැය කිහිපයක් ඇතුළතම චෙන්නායි පොලිසිය විශේෂ මෙහෙයුමක් දියත් කර සැකකරුවන් තිදෙනකු අත්අඩංගුවට ගත්තේය. තවත් පුද්ගලයන් කිහිපදෙනකුගෙන්ද ප්‍රශ්න කරමින් විමර්ශන ක්‍රියාත්මක වන බව ඉන්දීය මාධ්‍ය වාර්තා කළේය.

## ඉලක්කය වූයේ මන්ත්‍රීවරුන් 15 දෙනෙක්ද?

ටී.වී.කේ. පක්ෂය පවසන්නේ මෙය තනි පුද්ගලයකුට අල්ලසක් ලබාදීමේ උත්සාහයක් නොව, තම පක්ෂයේ මන්ත්‍රීවරුන් අවම වශයෙන් 15 දෙනකු එකවර කැඩී යාමට සැලැස්වීමේ සංවිධානාත්මක සැලැස්මක කොටසක් බවයි. එම සැලැස්ම සාර්ථක වූයේ නම්, සභාවේ බල තුලනය වෙනස් වී විජේගේ ආණ්ඩුව බරපතළ අර්බුදයකට මුහුණ දීමට ඉඩ තිබූ බව ටී.වී.කේ. නායකයන්ගේ අදහසයි.

## ටී.වී.කේ. ඇඟිල්ල දිගුකරන්නේ කා වෙතද?

ටී.වී.කේ. නායකයන් ප්‍රසිද්ධියේ චෝදනා කරන්නේ මෙම මෙහෙයුම පිටුපස හිටපු අමාත්‍ය වී. සෙන්තිල් බාලාජිගේ දේශපාලන කණ්ඩායම සිටින බවයි. මේ සම්බන්ධයෙන් ඔහුගේ සහෝදරයාට එරෙහිව එෆ්.අයි.ආර්. එකක්ද ගොනුකර ඇති බව ඉන්දීය මාධ්‍ය වාර්තා කර තිබේ.

කෙසේ වෙතත්, එල්ල වන චෝදනා ප්‍රතික්ෂේප කරන විපක්ෂය පවසන්නේ මෙය දේශපාලන වාසි ලබාගැනීම සඳහා නිර්මාණය කළ කතාවක් බවයි.

## විපක්ෂයේ ප්‍රතිචාරය

ඩී.එම්.කේ. පක්ෂය චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් ප්‍රකාශ කර ඇත්තේ, ජනතාව අතර පවතින අසතුට වෙනතකට හැරවීම සඳහා ටී.වී.කේ. පක්ෂය මෙම සිද්ධිය දේශපාලනිකව භාවිත කරමින් සිටින බවයි. මේ අතර ඒ.අයි.ඒ.ඩී.එම්.කේ.ද පාලක පක්ෂය විවේචනය කරමින් කියා සිටියේ, පාලනයේ අසාර්ථකත්වය වසාගැනීමට මෙවැනි චෝදනා ඉදිරිපත් කරන බවයි.

## ඉන්දියාවේ අලුත් දෙයක් නොවේ

ඉන්දියානු දේශපාලනයේ මන්ත්‍රීවරුන් වෙනත් පක්ෂවලට ඇදගැනීමේ චෝදනා අලුත් දෙයක් නොවේ. පසුගිය දශකය තුළ කර්නාටක, මහාරාෂ්ට්‍ර, මධ්‍ය ප්‍රදේශ්, ගෝවා සහ තවත් ප්‍රාන්ත කිහිපයකම මෙවැනි චෝදනා එල්ල වූ අතර ඇතැම් අවස්ථාවලදී ඒවා ආණ්ඩු වෙනස් වීමටද හේතු විය. එම නිසා තමිල්නාඩුවේ මෙම සිද්ධිය ඉන්දියාවේ දේශපාලන විද්‍යාඥයන්ගේ විශේෂ අවධානයට ලක්ව තිබේ.

## විජේගේ පළමු විශාල දේශපාලන පරීක්ෂණය

සිනමා ලෝකයේ අතිශය ජනප්‍රිය චරිතයක් වූ විජේ දේශපාලනයට පැමිණි විට බොහෝ දෙනකු සැක පළකළේ ජනප්‍රියත්වය පමණක් පාලනයකට ප්‍රමාණවත් නොවන බවයි. නමුත් 2026 මැතිවරණයෙන් ටී.වී.කේ. පක්ෂය ප්‍රබල ජයග්‍රහණයක් ලබා ආණ්ඩුව පිහිටුවීමත් සමග විජේ නව පරපුරේ ප්‍රධාන දේශපාලන නායකයකු බවට පත්විය.

මෙවැනි අර්බුදයකදී ආණ්ඩුවේ මන්ත්‍රී කණ්ඩායම එක්සත්ව තබා ගැනීම, නීතිය ක්‍රියාත්මක කිරීම සහ ජනතා විශ්වාසය රැක ගැනීම විජේගේ නායකත්වයට ඇති විශාලම අභියෝගය බව දේශපාලන විශ්ලේෂකයෝ පෙන්වා දෙති.

## විමර්ශනය අවසන් වන තෙක්

මේ වනවිට පොලිස් විමර්ශන ක්‍රියාත්මක වෙමින් පවතින අතර අත්අඩංගුවට ගත් පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේ. කෙසේ වෙතත්, විමර්ශන සහ අධිකරණ ක්‍රියාවලිය අවසන් වන තෙක් කිසිදු පාර්ශ්වයකට එරෙහි චෝදනා නීතිමය වශයෙන් ඔප්පු වී නොමැති බව සැලකිල්ලට ගත යුතුය.

## විග්‍රහය

මෙම සිද්ධිය අවසානයේ හෙළිදරව් කරන්නේ අල්ලස් කුමන්ත්‍රණයක්ද, නැතහොත් දේශපාලන චෝදනා හා ප්‍රතිචෝදනා පමණක්ද යන්න ඉදිරි විමර්ශනවලින් තීරණය වනු ඇත. එහෙත් එක කරුණක් පැහැදිලිය. තමිල්නාඩුවේ දේශපාලනය නව යුගයකට පිවිස ඇති අතර, විජේගේ ආණ්ඩුව මුහුණ දෙන පළමු විශාල දේශපාලන විශ්වාසභංග පරීක්ෂණය මෙය බවට සැකයක් නැත.

මාර්කස් ප්‍රනාන්දුපුල්ලේ

# තලපතිගේ ආණ්ඩුව පෙරළන්න ගහපු කෝටි තිස්පහේ කුමන්ත්‍රණය



මව්රට

ලිපිනය
නො: 22, ජයරත්න මාවත,
කොළඹ 05

කර්තෘ මණ්ඩලය
0112505134

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

බෙදාහැරීම්
0764 449 688

දැන්වීම්
0114870063

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ

## ගුරුදා විග්‍රහය



# අගවිනිසුරු පත්කිරීම ආතර්ගේ සිට පද්මන් සූරසේන දක්වා...

**'සිරිමාවෝ සමගි පෙරමුණු ආණ්ඩුවේ අධිකරණ ඇමැති ෆීලික්ස් ඩයස් හිටියේ යූ.ඇන්.පී.යත් එක්ක පුදුම වෛරයකින්...'**
**මේ, ජ්‍යෙෂ්ඨ වාමාංශික දේශපාලනඥයෙක් මෑතකදී කී කතාවය.**
**'මොකක්ද ඒ වෛරය..?'**

ඒක කවුරුත් දන්නේ නැති කතාවකි. ෆීලික්ස් ඩයස්ගේ පියා සීනියර් ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකි. ඩයස් බණ්ඩාරනායක පවුල ලංකාවේ ප්‍රකට නීතිවේදීන්ගේ පවුලකි. ලංකාව නිදහස ලබන විට අගවිනිසුරු ධූරයට පත්කිරීමට සුදුසුකම් සපුරා සිටියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිසුරු ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකය. ඒත් ලංකාවේ පළමු අගමැති ඩී.ඇස්. ඔහුට අග්‍රවිනිශ්චයකාර ධූරය දුන්නේ නැත. ඩී.ඇස්. නිදහස් ලංකාවේ පළමු ලාංකික අගවිනිසුරු ලෙස පත් කළේ නීතිපති ධූරය දරපු ආතර් විජයවර්ධනය. නිදහස් ලංකාවේ පළමු ලාංකික අගවිනිසුරු ධූරය තමාට අහිමි වීම ගැන ෆීලික්ස් ඩයස් සිටියේ කනස්සල්ලෙන්ය. එය ඔහුගේ පුතා ජූනියර් ෆීලික්ස් ඩයස්ට තදින් දැනුණි. තම පියාට ඩී.ඇස්. කළ අසාධාරණය නිසා ෆීලික්ස් ඩයස් ඩී.ඇස්.ගේ යූ.ඇන්.පී.යත් එක්ක වෛර බැඳගත්තේය.

ඩී.ඇස්. කොළඹ වුඩ්ලන්ඩ්ස් මන්දිරයේ සිට අගවිනිසුරු පදවිය සහ විනිසුරු පදවි සඳහා තනතුරු බෙදුවේ එහෙමය.

ඉන් පසු එන්නේ ෆීලික්ස් ඩයස්ගේ වාරයය. ඔහු 70-77 ආණ්ඩුවේ අධිකරණ ඇමැති විය. බණ්ඩාරනායක මැතිනියගේ සහෝදරයා බාන්ස් රත්වත්තේ සිටියේ පහළ අධිකරණයකය. අගමැතිනි බණ්ඩාරනායක මැතිනියගේ ඉල්ලීම පිට ෆීලික්ස් ඩයස් තමාටද ඥාති වූ බාන්ස් රත්වත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු ලෙස පත් කළේය. මැතිනියගේ කාලයේ අධිකරණය ගැන ජේ.ආර්.ගේ චරිතාපදානයේ සඳහන් වන්නේ මෙසේය.

'එක්සත් පෙරමුණු රජය විසින් තත්ත්වය තවත් පිරිහෙළමින් අධිකරණයේ ඉහළම තැන්වලට දේශපාලන වශයෙන් පක්ෂග්‍රාහී වූ විනිශ්චයකාරවරුන් පත්කිරීමට තත් දරා තිබිණි.

ඔවුන් අතුරෙන් එක් අයෙක් 1960 දශකයේ මුලදී ශ්‍රීලනිප මන්ත්‍රීවරයෙක් සහ ප්‍රාදේශීය නීතිඥයෙක් විය. එබඳු පත්කිරීම් මෙන්ම ඇතැම් විනිශ්චයකාරවරුන්ගේ ප්‍රකට පක්ෂග්‍රාහීත්වය විපක්ෂ මන්ත්‍රීවරුන්ගේත් පොදු මහජනතාවගේත් විවේචනයට භාජනය විය. මහජනතාවගේ විරෝධය පළවූයේ අසාමාන්‍ය විදියටය. බොහෝ අවස්ථාවලදී ක්‍රිකට් තරගයකදී හෝ පාපන්දු තරගයකදී හෝ ක්‍රීඩා විනිශ්චයකරුවකු සැක සහිත තීරණයක් හෝ තරගය පැවැත්වෙන ස්ථානයට අයත් පක්ෂයට වාසි වූ තීරණයක් හෝ දුන් අවස්ථාවක කලකිරුණු ප්‍රේක්ෂකයෝ මේ විනිශ්චයකාරවරුන්ගේ නම් කෑගසා කීවෝය...'

ජේ.ආර්. චරිතාපදානය
110 පිටුව

'අඩෝ...'

### හිටපු ජනාධිපතිවරු අගවිනිසුරු පත්කළ හැටි

එකල ක්‍රිකට් තරගවලදී ප්‍රේක්ෂකයෝ විනිසුරුවන්ගේ නම් කීවේ එලෙසය.

මැතිනියත්, ෆීලික්ස් ඩයසුත් අධිකරණය කෑවා කියලා බලයට ආ ජේ.ආර්. ජනාධිපති වෙලා අග්‍රවිනිශ්චයකාර ධූරයට පත් කළේ ඔහුගේ මිත්‍ර රාජ නීතිඥ නෙවිල් සමරකෝන්ය. ලංකා ඉතිහාසයේ පළමු වරට පිටින් නීතිඥයකු අගවිනිසුරු ධූරයට පත් කළ පළමු අවස්ථාව එය විය. ජේ.ආර්. වෝඩ් ප්ලේස්හි සිට අධිකරණය 1977 ජනවරමට ගළප්පා ගත්තේ එහෙමය.

1994 චන්ද්‍රිකා බලයට එන විට අගවිනිසුරු ධූරයේ සිටියේ ජී.පී.එස්. සිල්වාය. ඔහු අභියාචනාධිකරණයේ සභාපති ධූරය සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරු ධූරය දරා සුදුසුකම්වලින් පත්වූ අගවිනිසුරුවරයෙකි. ජ්‍යෙෂ්ඨත්වයෙන් සුදුසුකම් ලබපු ඔහුව පත් කළේ ප්‍රේමදාස ජනාධිපතිය. ඔහු 1999 විශ්‍රාම යන විට ජ්‍යෙෂ්ඨත්වයෙන් අගවිනිසුරු ධූරයට සුදුසුකම් ලබා සිටියේ මාක් ප්‍රනාන්දු විනිසුරුවරයාය. ඒත් චන්ද්‍රිකා ඔහුට කැමැති නොවීය.

ඇගේ ආණ්ඩුවේ අධිකරණ ඇමැති ජී.එල්. පීරිස් ප්‍රකාශයක් කරමින් කීවේ අධිකරණය 1994 චන්ද්‍රිකා සහ පොදු පෙරමුණ ලබපු ජනවරමට පටහැනිව ක්‍රියා කරන බවය. වසර 17ක යූ.ඇන්.පී. ආණ්ඩුව පත් කළ විනිසුරුවරුන් ආණ්ඩුවේ ඉදිරි ගමන කඩාකප්පල් කරන බව ඔහු කීවේය. මේ වනවිට චන්ද්‍රිකා වසර 17ක යූ.ඇන්.පී. ආණ්ඩුවේ දූෂණ සහ භීෂණ හොයන දේශපාලන මෙහෙයුම භාරදී තිබුණේ නීතිපති සරත් සිල්වාටය. යූ.ඇන්.පී. ආණ්ඩුවේ දූෂණ සහ භීෂණ සොයන ජනාධිපති කොමිසම් මෙහෙයවූයේ සරත් සිල්වාය. ජී.පී.එස්. සිල්වාගේ ධූර කාලය අවසන් වූ විට ඇය සරත් සිල්වාව අගවිනිසුරු ධූරයට පත් කළේ ඇයගේ න්‍යායපත්‍රය ක්‍රියාත්මක කරවා ගන්නටය.

2005 මහින්ද ජනාධිපති වනවිට සරත් සිල්වා අගවිනිසුරු විය. මහින්ද සරත් සිල්වාට පසු ජ්‍යෙෂ්ඨත්වයෙන් සුදුසුකම් ලබා සිටි අශෝක ඩි සිල්වා සහ ඔහුට පසුව ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරු ධූරවලට පත්කරනු ලැබීය.

එහෙත් බැසිල්ගේ දිවිනැගුම ව්‍යාපෘතියට එරෙහිව ශිරාණි බණ්ඩාරනායක තීන්දුවක් දුන්නා කියා ඇයට එරෙහිව දෝෂාභියෝගයක් ගෙනැවිත් ඇයව අගවිනිසුරු ධූරයෙන් පහකොට මහින්දගේ කැබිනට් මණ්ඩලයේ නීති උපදේශක ලෙස මහින්දම පත්කර තිබූ මොහාන් පීරිස්ව අගවිනිසුරු ධූරයට පත් කළේය. මහින්ද මොහාන් පීරිස්ව නීතිපති ධූරයට පත් කළේ ඔහු නීති වෘත්තියේ යෙදී සිටියදීය. ඔහු ඒ වනවිට නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කළේ නැත.

2015 මෛත්‍රී සහ රනිල් ආණ්ඩුව බලයට පත්වූ විට මොහාන් පීරිස්ට වහාම අගවිනිසුරු ධූරයෙන් ඉවත් වෙන්න බල කළේ මෛත්‍රී සහ රනිල් හොරු අල්ලන්න ලබපු ජනවරමට ඔහු බාධාවක් බව පවසමින්ය. ඔහු ඉවත් විය.

2019 ගෝඨා ජනාධිපති වනවිට අගවිනිසුරු වූයේ ජයන්ත ජයසූරියය. ඔහුව අගවිනිසුරු ධූරයට පත් කළේ මෛත්‍රී සහ රනිල්ය. ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙක් නොවීය. ඔහු මෛත්‍රී-රනිල් ආණ්ඩුවේ නීතිපති විය. මෛත්‍රී සහ රනිල් ඔහුව අගවිනිසුරු ලෙස පත් කළේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවන් නොතකා හරිමින්ය. ඒත් ගෝඨා ඔහුව වෙනස් කළේ නැත.

2025 අනුර ජනාධිපති වනවිට අගවිනිසුරු ධූරයේ සිටියේ ජයන්ත ජයසූරියය. ඔහු විශ්‍රාම ගිය විට අනුර පත්කළේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරියක වූ මුර්දු ප්‍රනාන්දුය. ඇය විශ්‍රාම ගිය විට අනුර පත්කළේ ශ්‍රේෂ්ඨාධිකරණයේ එවැනිම ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයකු වූ ප්‍රීති පද්මන් සූරසේනය.

ප්‍රීති පද්මන් සූරසේන විනිසුරුතුමා මහාධිකරණ විනිසුරුවරයකුව සිටියදී හිටපු විගණකාධිපති ලලිත් අඹන්වලට ඇසිඩ් ගැසීමේ චූදිතයන්ට වසර 10 සිට 70 දක්වා සිර දඬුවම් නියම කොට නිර්භය තීන්දු දෙන විනිසුරුවරයෙක් ලෙස ප්‍රකට විය. ඔහුව අභියාචනාධිකරණයට පත්කළ මෛත්‍රීපාල ජනාධිපති ව්‍යවස්ථා කුමන්ත්‍රණයකින් අගමැති රනිල් ඉවත් කොට මහින්දව අගමැති කළ විට ඊට එරෙහිව තීන්දුව දුන්න විනිසුරු වන්නේද පද්මන් සූරසේනය.

ඒ වෙලාවේ ලංකාවේ ජනප්‍රියතම නායකයා වූ මහින්දට අගමැති ධූරය දැරීම තහනම් කරමින් ඔහු දුන් නියෝගය ඓතිහාසික තීන්දුවක් විය. මෛත්‍රීපාල ජනාධිපති ධූරයෙන් යන විට ඔහුට කැබිනට් මණ්ඩලය පැජට් පාරේ නිවස තෑග්ගක් ලෙස දීම වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් දුන්නේත් ප්‍රීති පද්මන් විනිසුරුවරයාය. 2018 රනිල්ව අගමැති ධූරයෙන් ඉවත් කිරීම ව්‍යවස්ථා විරෝධී යැයි තීන්දු කළ ප්‍රීති පද්මන් විනිසුරුතුමා 2023 රනිල් ජනාධිපති වී පුංචි ඡන්දය තියන්න සල්ලි නැහැ කී විට පුංචි ඡන්දයට වෙන් කළ මුදල් මුදාහැර ඡන්දය තියන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්ට නියෝග කරන තීන්දුවත් දුන්නේය.

ප්‍රීති පද්මන් අගවිනිසුරුතුමා ජනාධිපතිවරු දෙදෙනෙක්ට සහ අගමැතිවරයෙක්ට එරෙහි තීන්දු දුන්න විනිසුරුවරයෙකි.

2024 ජනතාව අනුරව බලයට ගෙන ආවේ හොරු අල්ලන්නටය. ප්‍රීති පද්මන් අගවිනිසුරු ඒ ජනවරම ක්‍රියාත්මක කරන්න හොඳම අගවිනිසුරුවරයාය. හැබැයි ඔහු මේ වසරේ අවසානයේ විශ්‍රාම යෑමට නියමිතය.

### අනුර අත්ත බිඳෙයි පය බුරුලෙන්...

'අනුරගේ තීරණය කුමක්ද...?'

හොරු ඇල්ලීමත්, අධිකරණයේ ස්වාධීනත්වයත් ආරක්ෂා කරගනිමින් අනුරට කියන්න වෙන්නේ අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන් කියාය.

උපුල් ජෝෂප් ප්‍රනාන්දු

වාර්තා පිට වාර්තා තබමින්

# තියෙන ඔක්කොම රන් පදක්කම් තමන් සතු කරගත් පේරාදෙණියේ සුපිරි බුලට් එක

**ලංකාවේ සරසවි ඉතිහාසය ඇතුළේ 'කැම්පස් ලයිෆ්' එක කියන්නේ එක එක අයට එක එක විදියේ අත්දැකීමක්. සමහරුන්ට ඒක ආදරය, තවත් සමහරුන්ට දේශපාලනය, තවත් සමහරුන්ට යන්තම් ඩිග්‍රිය ගොඩදාගෙන ජොබ් එකක් හොයාගන්න තියෙන කඩඉමක්. හැබැයි මේ හැමෝම අතරේ මුළුමහත් සරසවියකම ඇස් තමන් වෙතට විතරක් හරවාගන්න පුළුවන්, මුළු ලෝකයක් කතාකරන ජාතියේ අසාමාන්‍ය චරිත බිහිවෙන්නේ කලාතුරකින්.**

පසුගිය ජූනි 24 වැනිදා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ පළමු සැසිය පැවැත්වුණු ශාලාව ඇතුළට අපි මොහොතකට ගියොත් එතැන තිබුණේ වෙනදා දකින නිහඬතාවක් සහ ඒ නිහඬතාව බිඳදැමූ අත්පොළසන් නාදයක්. හැමෝගෙම කටවල් ඇරුණේ හැමෝගෙම ඇස් උඩ ගියේ එකම එක තරුණයෙක් තමන්ගේ නම කියද්දී වේදිකාව දෙසට පියනගපු ඒ අපූරු දර්ශනය නිසයි. ඔහු නමින් L.B.W.W. Wickramasooriya.

හිතන්න හන්තාන කඳුවැටිය පාමුල, මීදුමෙන් වැසුණු සුන්දර පේරාදෙණිය සරසවියේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව කියන්නේ මෙරට ඉහළම විද්‍යාත්මක පර්යේෂණ සිද්ධ වෙන, හොඳ තරගකාරීත්වයක් තියෙන, මොළකාරයන්ගෙන් පිරුණු තැනක්. ඒ වගේ සංකීර්ණ විෂය පථයක් තියෙන වටපිටාවක වසර හතරක් පුරා තමන්ගේ නොසැලෙන උත්සාහයත්, තියුණු බුද්ධියත් එකට අඹරලා මේ තරුණයා කරපු වික්‍රමය ඇහුවොත් ඔයාලට පිස්සු හැදෙයි. අපි හැමෝම දන්නවා කැම්පස් එකක GPA එක 3.5ක් දාගන්නත් කොච්චර කට්ටක් කන්න ඕනෙද කියලා. හැබැයි මේ කෙල්ලෙක් දිහා නොබලා, සෙල්ලමකට කාලය නාස්ති නොකර, පොතපතේම ගැලිලා හිටපු මේ සුපිරි මොළකරු තමන්ගේ අවසාන GPA අගය විදියට සටහන් කරගෙන තිබුණේ 3.98 / 4.00ක් වැනි අදහාගත නොහැකි සීමාවක්. ඒ කියන්නේ මුළු අවුරුදු හතර පුරාම ලියපු හැම විභාගයකටම වගේ ඔහු අරන් තියෙන්නේ ඉහළම A සාමාර්ථ. මේක නම් නිකන්ම නිකන් මනුස්සයෙක්ට කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. රසායනික බන්ධන එක්ක ජීවත් වුණු සැබෑ රසායන විද්‍යා මායාකාරයෙක්ට විතරක්ම කළ හැකි දෙයක්.






ඉතින් පළමු පන්තියේ ගෞරව සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ ගෞරවවේදී උපාධිය ඔහු සිපගත්තේ මුළු සරසවියටම ආදර්ශයක් වෙමින්. හැබැයි කතාව එතැනින් ඉවර වෙන්නේ නැහැ. උපාධි ප්‍රදානෝත්සවයේ නියම අවස්ථාව පටන් ගත්තේ ඊට පස්සේ. සාමාන්‍යයෙන් එක එක විෂයන්වලට, එක එක දක්ෂතාවලින් ඉහළටම එන අයට එක එක පදක්කම්, ශිෂ්‍යත්ව බෙදිලා යන එකනේ සිරිත. හැබැයි මෙවර පේරාදෙණියේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිරිනමන ලද සියලු ශිෂ්‍යත්ව, ත්‍යාග සහ රන් පදක්කම් මේ වික්‍රමසූරිය කියන තනි මිනිහෙක් තමන්ගේ සන්තකයට ගන්නකොට මුළු හෝල් එකේම හිටපු මහාචාර්යවරු පවා පුදුමයෙන් බලා සිටියා. මේක එක රැයකින්, වාසනාවට ආපු ජයග්‍රහණයක් නෙවෙයි. ඔහු වසර හතරක් පුරා ලේ, කඳුළු, දහඩිය හලලා ක්‍රමයෙන් ගොඩනගපු අධ්‍යයන අධිරාජ්‍යයක ප්‍රතිඵලයක්.

අපි එහෙනම් කාලය ආපස්සට හරවලා ඔහුගේ මේ සිවු වසරක සරසවි දිවියේ නොලියවුණු රහස් පිටු ටිකක් පෙරළලා බලමු. ඔහු කැම්පස් එකට ආපු පළමු වසරේ ඉඳන්ම පෙන්වූයේ අමුතුම දක්ෂතාවක්. පළමු වසර විභාගයේදී ජීව විද්‍යාව විෂයෙන් ඉහළම දක්ෂතා දක්වමින් මහාචාර්ය B.L.T. De Silva අනුස්මරණ ශිෂ්‍යත්වය දිනාගත්ත ඔහු එතැනින් නැවතුණේ නැහැ. සමස්ත කණ්ඩායමේම ඉහළම ප්‍රතිඵලය වෙනුවෙන් පිරිනමන විජිත මාලේවන අනුස්මරණ ශිෂ්‍යත්වයත්, පේරාදෙණිය විශ්වවිද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය මගින් පිරිනමන විශේෂ ශිෂ්‍යත්වයත් තමන්ගේ සාක්කුවට දාගත්තේ හැමෝටම තමන් කවුද කියලා පළමු වසරේදීම පෙන්වලා දෙමින්. ඊට පස්සේ මුළු සමස්ත විද්‍යා පීඨයේම ඉන්න වඩාත් සුදුසුකම් ලත් සහ දක්ෂතම ශිෂ්‍යයාට විතරක් හිමිවෙන කීර්තිමත් දේශප්‍රිය අනුස්මරණ ශිෂ්‍යත්වයත් ඔහු සතු කරගත්තේ නිතරග යෙන්ම වගෙයි.

ඔහුගේ මේ ගමන දිහා බලාගෙන හිටපු යාළුවෝ හැමදාම කිව්වේ 'මූ නම් මිනිහෙක් නෙවෙයි, යකෙක්' කියලා. මොකද පළමු වසර දෙක ඇතුළත රසායන විද්‍යාවෙන් ලංකාවේ ඉහළම සමුච්චිත GPA අගය රඳවා ගැනීම වෙනුවෙන් පිරිනමන Sulthanbawa අනුස්මරණ සම්මානයත් 2024 වර්ෂයේදී ඔහු දිනාගත්තා. තෙවැනි වසරට යද්දී විෂය කරුණු තවත් සංකීර්ණ වෙනවා, හැමෝම ටිකක් අමාරුවේ වැටෙනවා. හැබැයි වික්‍රමසූරිය සිසුවාට ඒක තවත් එක සෙල්ලමක් විතරයි. ඔහු තෙවන වසරේදී මහාචාර්ය H.W. Dias ශිෂ්‍යත්වයත්, තෙවැනි සහ සිවුවැනි වසරවල කාබනික රසායන විද්‍යාව විෂයෙහි දැක්වූ අසිරිමත් විශිෂ්ටත්වය වෙනුවෙන් Sulthanbawa අනුස්මරණ ත්‍යාගයත් තමන්ගේ නමට ලියාගත්තා. අවසානයේදී ඔහුගේ අධ්‍යයන දිවියේ උච්චතම අවස්ථාව, නැත්නම් 'කූටප්‍රාප්තිය' සනිටුහන් කරමින් රසායන විද්‍යාවේ අතිවිශිෂ්ටයාට පමණක් හිමිවෙන ජී.පී. වත්තිගම රන් පදක්කම සහ Bhikaji Framji Khan රන් පදක්කම කියන රන් පදක්කම් ද්විත්වයම තමන්ගේ පපුවේ පලඳාගන්න තරම් ඔහු භාග්‍යවන්තයෙක් මෙන්ම අතිදක්ෂයෙක් වුණා. රන් පදක්කම් දෙකක් එකම බෙල්ලක දිළිසෙද්දී ඒ දෙස බලා සිටි ඔහුගේ මවුපියන්ගේ ඇස්වලින් වැටුණු කඳුළු බින්දුවල වටිනාකම මෙතකැයි කියලා කියන්න බැහැ.

ඇයි අපි මේ කතාව මේ තරම් උනන්දුවෙන් කතා කරන්නේ? මේක හුදෙක් එක එක පුද්ගලයෙක්ගේ පෞද්ගලික දක්ෂතාවක් සැමරීමක් විතරක්ම නෙවෙයි. අද කාලේ ලංකාවේ නිදහස් අධ්‍යාපනය ගැන, අපේ රටේ සරසවි පද්ධතිය ගැන ඍණාත්මක විවේචන ඕනෑ තරම් ඇහෙනවා. ඩිග්‍රියක් කියන්නේ 'යන්තම් ෂේප් එකේ පාස් වෙලා බේරෙන්න ඕන එකක්' කියලා හිතන, අනාගතය ගැන බලාපොරොත්තු අත්හැරලා දාපු පරම්පරාවකට වික්‍රමසූරිය කියන්නේ කම්මුල් පාරක් වැනි ජීවමාන ආදර්ශයක්. කාබනික සංයෝගවල තියෙන ශක්තිමත් සහසංයුජ බන්ධන වගේම තමන්ගේ හදවත ඇතුළේ තියෙන අධිෂ්ඨානයත්, නොසැලෙන කැපවීමත් ශක්තිමත් නම්, මේ ලෝකයේ ජයගන්න බැරි කිසිම අසීරු ඉලක්කයක් නැති බව ඔහු පේරාදෙණිය සරසවි ඉතිහාසයට රන් අකුරින් ලියලා අවසන් කරලා තියෙනවා. ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ මහිමය, මේ පුංචි තිතක් වැනි දූපතේ තියෙන බුද්ධිමය ශක්තිය මුළු ලෝකය ඉදිරියටම අරන් යන්න මෙන්න මේ වගේ දෑස්වල විද්‍යාත්මක කුතුහලය පිරුණු, මොළේ කල්පනා කරන තරුණයෝ තවත් බිහිවෙන්න ඕනේ. පේරාදෙණියෙන් බිහිවුණු මේ රසායන විද්‍යාවේ අසහාය, දීප්තිමත් තාරකාවට, ඉදිරි විද්‍යාත්මක පර්යේෂණ ලෝකය උඩුයටිකුරු කරන්න, ලංකාවේ නම ලෝක සිතියමේ රන් අකුරින් ලියවන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා අපි හැමෝම එකතුවෙලා හදවතින්ම සුබ පතමු... ඔයාලත් මේ සැබෑ වීරයාට සුබ පතන්න අමතක කරන්න එපා.

මාර්කස් ප්‍රනාන්දුපුල්ලේ

# MR සහ කොත්තු



**මිස්ටර් කියලා කිව්වම ඊළඟට ඔයාට කෑමක නමක් කියන්න කිව්වොත් මතක් වෙන්නේ මොනවාද? හරි. හොඳයි. ඔයාට මතක් වුණේ රටේ හැමතැනම තියෙන, සද්ද දාලා හදන, චීස් දැම්මම වෙනම ජොලියක් තියෙන, මටන් එක්ක බීෆ් එක්ක, පෝක් එක්ක කන්න පුළුවන්කම තියෙන, සමහර තැන්වල 2000ට 3000ට යන සමහර තැන්වල 600ට 700ට හම්බවෙන කෑමක් නේද? අපි කියන්න යන්නේ ඒ ගැන තමයි. හැබැයි රහ ගුණ ගැන නෙවෙයි.**

මේ කතාවෙන් ගන්න තියෙන දේ තමයි සමාජ මාධ්‍යයත් එක්ක ගනුදෙනු කරනවා නම්, සමාජ මාධ්‍ය ඇතුළේ ඔබ ජීවත් වෙනවා නම්, සමාජ මාධ්‍ය ඇතුළේ වීරයෙක් වෙනවා නම් ඒ වීරයා නඩත්තු කරන එකත් කරන්න. එහෙම කරන්න බැරි නම් සෝෂල් මීඩියා ඇතුළේ 'පොරත්වයක්' හදාගන්න එපා.

අපි ඔහුව දැකලා තිබුණේ නැහැ. අපි ඔහුව දැක්කේ ඔහු අපිට ඔහුව පෙන්නපු නිසා. ඔහු ඒ වැඩේට වියදම් කළා, මහන්සි වුණා, ඒකට මිනිස්සුන්ව හයර් කරන්න ඇති. එහෙම කරලා ඔහු අපිට ඔහුව පෙන්නුවා. ඔහු කරන දේවල් පෙන්නුවා. ඔහු වීරයෙක් බවට සමාජ මාධ්‍ය ඇතුළේ බලහත්කාරයෙන් ඔහුම පත්කර ගත්තා. ඉන් පස්සේ අපි ඔහුගෙන් වීරයෙක් බලාපොරොත්තු වුණා. ඔහු සුදු චරිතයක් බව සමාජ මාධ්‍ය ඇතුළේ අපිට පෙන්නුවා. අපි ඔහුගෙන් සුදු චරිතයක් බලාපොරොත්තු වුණා. ඔහු අපිට කිව්වා ඔහු මාරයි කියලා. අපි ඔහුගෙන් මාරකම බලාපොරොත්තු වුණා. අපිට ඔහු ඔහුව පෙන්නන්නේ නැතුව හිටියා නම් ඔහු කනේ පාරක් ගහන එකවත්, තව කෙනෙක්ට තර්ජනය කරන එකවත් අපිට අදාළ වෙන්නේ නැහැ.

හැබැයි ඔහු අපිට ඔහු වීරයෙක් බව පෙන්නලා ඔහුගේ කඩවල් ඇතුළට අපිව ගෙන්න ගත්තා. ඔහුගේ බ්‍රෑන්ඩ් එක ඔහු අපේ අතරට එව්වා. ඒ බ්‍රෑන්ඩ් එක අපි අතරට ඔහු එවලා ඔහු ඒකෙන් ලාභ උපයා ගත්තා. අන්න ඒ ලාභ උපයා ගත්ත ඔහුට දැන් අයිතියක් නැහැ අපිට නොගැළපෙන විදිහට ජීවත් වෙන්න. අපේ හිත ඇතුළේ තිබ්බ ප්‍රතිරූපය බිඳපු ගමන් අපි ඔහුට වටකරගෙන ගහනවා. ඒක තමයි ඔහුට වුණේ. කාටත් එහෙමයි. ප්‍රතිරූප නිර්මාණය කරගත්ත මිනිස්සුන්ට තමන්ගේ ප්‍රතිරූපය වෙනස් කරගන්න අයිතියක් නැහැ. හේතුව මේ ප්‍රතිරූපයට අපි කැමැති නිසා සහ අපි ඒ ප්‍රතිරූපය තුළින් ඔහුව දකින නිසා, ඔහුව මනින නිසා.

සමාජ මාධ්‍යවලට කිසිම විනයක් නැහැ. ඔබ දන්නවද දන්නේ නැහැ ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍යවලට නියාමනයක්, ආචාරධර්ම පද්ධති කිසි දෙයක් නැහැ. සමාජ මාධ්‍ය ඇතුළේ මට දැන් අවශ්‍ය නම් ඕනෑම පුද්ගලයෙක්ට අපහාස කරලා පෝස්ට් එකක් දාන්න පුළුවන්. ඒක දැම්මට පස්සේ මට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්න එක වෙනම කතාවක්. හැබැයි මම ඒක දාලා, ඒක වයිරල් වෙලා, ඒක මිනිස්සු අතරට ගිහිල්ලා, ලක්ෂ පහක්, දහයක් සමහර විට මිලියනයක් දෙකක් බැලුවට පස්සේ ඒ දාපු එක අයින් කරගත්තත් එකයි නැතත් එකයි. ඕක තමයි හැබෑ කතාව. ඒක නිසා මතක තියාගන්න සමාජ මාධ්‍ය කියලා කියන්නේ කාගෙවත් අම්මගේ අප්පගේ බූදලයක් නෙවෙයි.

සමාජ මාධ්‍ය ඇතුළේ තමන් වීරයෙක් නිර්මාණය කරනවා නම් ඒ වීරයාව නඩත්තු කරන්න ඕනේ. කඩේට යද්දි අඳින ඇඳුම ගැන පවා ඔබට දෙපාරක් හිතලා කරන්න වෙනවා. ඔබ අතින් අල්ලන්නේ කාගෙද? ඔබ හිනාවෙන්නේ කවුරු එක්කද? ඔබ කන්නේ මොනවද? ඔබ හිටගන්නේ කොතැනද? ඔබ ඉඳගන්නේ කොතැනද? කියන එක ඔබට බලන්න සිද්ධ වෙනවා. එහෙම මේක නඩත්තු කරගන්න බැරි නම් ඔබට තියෙන්නේ පැත්තකට වෙලා ඉන්න.

මේ තරුණයා සල්ලි සුදු කරනවද කළු කරනවද, ඒ කාගේ සල්ලිද කියන චෝදනා ගැන අපිට වැඩක් නැහැ. ඔහුගේ කෑම රසද නැද්ද කියන එක අපිට වැඩකුත් නැහැ. ඒ කඩවල් ඇතුළේ ඔහු කරන දේ අපිට වැඩකුත් නැහැ. හැබැයි මේකෙන් ගන්න තියෙන පණිවුඩය තමයි ඔබ නඩත්තු කරනවා නම් ඔබව ඔබට ඔබව නඩත්තු කරන්න සිද්ධ වෙනවා.

අපි දන්නේ නැහැ ඥානා මුදලාලිලා නවලෝක මුදලාලිලා කඩවල් ඇතුළේ හැසිරුණේ කොහොමද කියලා. අපි දන්නේ නැහැ ඒ මිනිස්සු තමන්ගේ ගෝලයින්ට ගැහුවද බැන්නද නැද්ද කියලා. මොකද ඒගොල්ලෝ සෝෂල් මීඩියා ඇතුළේ ඒගොල්ලන්ව අපිට පෙන්නලා තිබුණේ නැහැ. අපි දැනුයි ඒගොල්ලන්ගේ කතන්දර දන්නේ. කතාව ලියන කෙනා ලියන්නේ රස දේවල් ටික විතරයි, හොඳ දේවල් ටික විතරයි, නිර්මාණශීලී දේවල් ටික විතරයි.

ලංකාවේ ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන තුනක් තියෙනවා. ඒ මාධ්‍ය ආයතන තුනේ එක මාධ්‍ය ආයතනයක මාධ්‍ය සහ වෙනත් ව්‍යාපාර තියෙන තැනක පටියක් අරගෙන කාමරයක දාගෙන සේවකයන්ට ගැහුවා කියලා අපි අහලා තියෙනවා. ප්‍රසිද්ධ මාධ්‍ය ආයතන දෙකක් තිබිලා තියෙනවා. පුවත්පත් ආයතන වෙන්නත් පුළුවන් සමහර විට ඒවා. ඒවායේ හිමිකාරයෝ පොඩි වැරැද්දක් අහු වුණාම මිනිස්සුන්ට ගහලා, බැනලා, දත් කඩලා, ඉස්පිරිතාලවල නවත්තලා, පොලිසියට අල්ලලා දීලා ප්‍රශ්නේ විසඳනවා. ගොඩක් කඩවල්වල කතාව ඕක තමයි. රතිඤ්ඤා මඩුවල කතාව ඕක තමයි. සමහර වෙලාවට රතිඤ්ඤා මඩුවල බෝම්බ පුපුරනවා. සමහර වෙලාවට කඩවල්වල වැඩ කරන මිනිස්සුන්ට ගහලා ගහලා පොලිසියට බාර දෙනවා. මේක හරි නෑ. මේක වැරදියි. හැබැයි මේක තමයි ක්‍රමය. මේ ක්‍රමය එළියට එනතාක් කල් මේවා ඇතුළේ මේ ජඩ වැඩ සිද්ධ වෙනවා. හැබැයි අපි දන්න කෙනාගේ තියෙන ප්‍රශ්නය තමයි එයා එළියේ බෝධිසත්වයෙක් වෙලා, සිල් අරගෙන, ලෝකෙට බයිලා කියලා, බණ කියලා, වැඩකරන මිනිස්සුන්ව බදාගෙන උම්මා දීලා, තනතුරුවලින් උසස් කරලා 'හොඳයිද බොස් හොඳයිද බොස් හොඳයිද' කිය කියා කටමැත දොඩවලා අන්තිමට කඩේ ඇතුළට ගිහිල්ලා කනට ගහනවා, කුණුහරුපයෙන් බණිනවා.

ඒ වගේම මේ මනුස්සයා දන්නේ නැහැ සමාජ මාධ්‍ය කියන්නේ මොකක්ද කියලාවත් අඩුම තරමේ. ඒවාට තමන් පොදුවේ දේවල් දැම්මට පස්සේ මේක ඇතුළේ ඉන්න උන් ඒවා එළියට දානවා. තමන්ගේ සීසීටීවී කැමරාවෙන් තමන් ගිහිල්ලා කනට ගහන එක එළියට යන එක නවත්වා ගන්න බැරි මේ මිනිස්සු තමයි සෝෂල් මීඩියාවල ඇවිල්ලා පම්පෝරි ගහලා තියෙන්නේ. බලාගෙන ගියාම මේගොල්ලෝ අදාළ කෑම වර්ග හදන්න දන්නෙත් නැහැ, සමාජ මාධ්‍ය නඩත්තු කරන්න දන්නෙත් නැහැ. ඇතුළේ ඉන්න සුදු මිනිහා කළුම කළුයි. හැබැයි මේ කළු මිනිහටවත් බැහැ තමන්ව හරියට නඩත්තු කරගන්න.

ඒ නිසා මේ සමාජ මාධ්‍ය කියලා කියන්නේ පිස්සන්ට පිස්සු කෙළින්න තියෙන එකක් නෙමෙයි කියලා විතරක් අපි අවසාන වශයෙන් ඔබට මතක් කරනවා. මේක ඇතුළේ යම් ක්‍රමවේදයක් නැතුව ජීවත් වෙන්න ගියොත් එහෙම ඉවරෙටම ඉවරයි. අර නන්දා මාලනී කියන්නේ 'පූජාසනයේ ඔබ හිඳුවා ඔබට පුදන මේ ලෝකයමයි හෙට ඔබට එරෙහි වී නැගිටින්නේ' කියලා. ඒක හරියටම හරි. මොකද ඒකට හේතුව මල් තිබ්බ එකාට අයිතියක් තියෙනවා ගල් ගහන්න. මොකද ඔබව උස්සලා තියලා තියෙන්නේ කරු ගහගෙන, කරු අල්ලගෙන ඉඳලා තියෙන්නේ කරේ තියන් ඉඳලා තියෙන්නේ ඒ මිනිහා. කරේ තියන් හිටපු එකාට තමයි අයිතිය තියෙන්නේ පොළොවේ ගහන්න. කරේ තියන් හිටියේ නැත්නම් පොළොවේ ගහන්න අයිතියක් නැහැ. හැබැයි කරේ තියන් හිටපු එකා තමයි දන්නේ මේ බර.

මේක අවබෝධ කරගන්න බැරි නම් මේක තේරුම් ගන්න බැරි නම් සෝෂල් මීඩියාවලට එන්න එපා. තමන්ගේ ප්‍රොෆයිල් එකක් හදාගෙන, තමන්ගේ පින්තූරයක් දාගෙන, කවියක් සින්දුවක් ලියාගෙන, බණක් භාවනාවක් කරගෙන සමාජ මාධ්‍ය ඇතුළේ ඉන්න. සමාජ මාධ්‍ය තුළින් තමන් නඩත්තු වෙනවා නම් මතක තියාගන්න ඔබ ඔබට අයිති නැහැ කියන එක. සමාජ මාධ්‍ය ඇතුළේ ඔබ ඔබේ ලෝකය ගොඩනගනවා නම් ඔබට තනිකරම ජීවත් වෙන්න සිද්ධ වෙන්නේ ආර්ටිෆිෂල් මනුස්සයෙක් වගේ සමාජ මාධ්‍යවලට ගැළපෙන විදිහට.

ඔබ අඳින ඇඳුම ගැන පවා ඔබට හැම තත්පරයකම හිතන්න සිද්ධ වෙනවා. මොකද ඔබ පාරේ යද්දී ඔබව වීඩියෝ කරලා කවුරු හරි දාන්න පුළුවන්. ඉස්සර වගේ නෙවෙයි, මිනිස්සුන්ගේ ඩෑෂ් කැමරා තියෙනවා, සීසීටීවී කැමරා තියෙනවා. හැම මිනිහෙක්ගෙම අතේම මොබයිල් ෆෝන් එකක් තියෙනවා. ඔබ යන එන අඳින පලඳින කන බොන හැම වෙලාවකම අහල පහළ ඉන්න කෙනෙක් ඔබේ ෆොටෝ එකක් ගන්න පුළුවන්.

ඔබට තියෙනවා ඔබේ වටයක්. ඔබේ මිතුරන්, පුංචි කාලේ ඉඳන් දන්න අය, පවුලේ අය, නෑදෑයෝ. ඒගොල්ලන්ගෙන් පිටට ඔබව දැනගන්න ප්‍රසිද්ධ වෙන්න පටන් ගන්න දවසෙම ඔබට ඔබව අහිමි වෙනවා කියන එක මතක තියාගන්න. ඔබ මිස්ටර්ද නැද්ද කියන එක තීරණය වෙන්නේ ඇත්තටම ඔබේ හැසිරීම මත. ඒ නිසා ඔබ මහත්තයෙක් වෙන්නේ නැහැ තමන් මහත්තයෙක් බව ලෝකය ඉදිරියේ පුන පුනා කිව්වට. පුන පුනා මහත්තයෙක් බව කියලා මහත්තයෙක් බවට පෙනී ඉඳලා මහත්තයෙක් බව පෙන්නලා පෙන්නලා පෙන්නලා පෙන්නලා අන්තිමට පාත්තයෙක් බවට පත්වුණාට පස්සේ කොත්තුත් නෑ තොත්තුත් නෑ.



ජීවන පහන් තිළිණ

## ශ්‍රී ධර්ම නිකේතනයේ සිල් සමාදන් වන පින්වතුන්ට ආසන පරිත්‍යාග කෙරේ



කොළඹ 14 ශ්‍රී ධර්ම නිකේතනය විහාරස්ථානයේ පොහෝ දිනවල සිල් සමාදන් වන පින්වතුන්ට අත්‍යාවශ්‍යව පැවැති ආසන (සිල් පුටු) පරිත්‍යාග කිරීම පසුගිය පොසොන් පොහෝ දින (29) විහාරාධිපති පූජ්‍ය දීපානන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් සිදුකෙරිණි.

මෙම පින්කම සඳහා පූර්ණ අනුග්‍රහය දැක්වූයේ ග්‍රෑන්ඩ්පාස්හි ප්‍රසිද්ධ ව්‍යාපාරික චානක දේශප්‍රිය මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් විසිනි.

තිළිණ මදුශාන්




රාජ්‍ය රහස්

# චීන උත්සවයට ජනාධිපති නොගියේ ඇයි



කපිල පුංචිමානගෙන්

රාජ්‍ය රහස්

## ආණ්ඩුවයි විපක්ෂයයි එක පාරක

**මේ දිනවල දේශපාලන කරළියේ ප්‍රධාන මාතෘකාව බවට පත්ව ඇත්තේ දූෂණ චෝදනා ලැබූ මැතිඇමැතිවරුන්, නිලධාරීන් අත්අඩංගුවට පත්වීමය. පසුගිය සතිය වනවිට හිටපු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතාගේ පුත් රකීන රාජපක්ෂ, චරිත් අබේසිංහ යන අය පාතාල නායක 'හරක් කටා'ගෙන් මුදල් ලබාගැනීමේ සිද්ධියක් මත අත්අඩංගුවට පත්වූ අතර, රාජපක්ෂ පවුලේ ප්‍රබලයන් කිහිප දෙනකුම් අත්අඩංගුවට පත්වීමට නියමිතව ඇති බවටද ඇතැම් මාධ්‍ය තොරතුරු වාර්තා කොට තිබිණි.**

මේ සිදුවීම් දාමය හරහා විපක්ෂය නියෝජනය කරන ප්‍රධාන කණ්ඩායම් දෙකෙන් එක් කණ්ඩායමක් පසුගිය සතිය වනවිට බරපතළ අර්බුදයකට තල්ලු වෙමින් තිබූ ආකාරයක් සියල්ලන්ටම දැකගත හැකි විය. මෙහිදී අප විපක්ෂ කණ්ඩායම් දෙකෙන් එක් කණ්ඩායමක් ලෙස තොරතුරු වාර්තා කළේ මේ වනවිට විපක්ෂය තුළ කණ්ඩායමක් දෙකක් බිහිව තිබීම නිසාය. ඉන් එක් කණ්ඩායමක් වන්නේ ඡන්දයක් ඉල්ලා කිසිසේත්ම ජයග්‍රහණය කළ නොහැකි, ජනතාවගේ කිසිදු ප්‍රසාදයක් නැති, විවිධ පක්ෂවලින් මැතිවරණවලට ඉදිරිපත් වී දේශපාලන සුජාතභාවය අහිමි කරගත්, කුජීත ලෙස පරාජයට පත්ව සිටින, පැවැති සෑම ආණ්ඩුවකම ඇමැති ධුර දරා ජනතා විශ්වාසය අහිමි කරගත්, දූෂණ, වංචා චෝදනා සහ නඩු දුසිම් ගණන් පවතින පිරිසක් සිටින, නමට පමණක් විපක්ෂය කියාගත් පිරිසක්ද මේ වනවිට බිහිව සිටීම නිසාය. වරෙක ඔවුන් 'ඒකාබද්ධ විපක්ෂය' ලෙස තමන්වම හඳුන්වා ගන්නා අතර, තවත් වරෙක 'පොදු විපක්ෂය' ලෙස තමන්ව හඳුන්වා ගන්නා ආකාරයක්ද දැකගන්නට පුළුවන.

මේ නඩුහබවලින් බේරෙන්න නාමිකව ගොඩනගාගත් විපක්ෂයට අමතරව රටේ ප්‍රධාන විපක්ෂය වූ සමගි ජන බලවේගය ප්‍රධාන පක්ෂ කිහිපයක්ද රට ඇතුළේ පවතී. මෙහි ප්‍රධාන පක්ෂය වන සජබයේ මන්ත්‍රීවරුන්ට කිසිදු දූෂණ චෝදනාවක් එල්ල වී නොමැති අතර, ඔවුන් පැහැදිලිවම ආණ්ඩුවට එරෙහිව පිරිසිදු දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජනතාවට නායකත්වය දෙන ආකාරයක් දැකගැනීමට පුළුවන. ඒ අනුව ආණ්ඩුව සහ විපක්ෂය යනුවෙන් ජනතාව අතර මේ වනවිට නිල පිළිගැනීම හිමිව ඇත්තේ මාලිමාවටත්, සජබයටත් පමණි. ආණ්ඩුව පාතාලය මර්දනය කරමින්, හොරු අල්ලමින් සිය දේශපාලන සිදුකරන අතරවාරයේ ප්‍රධාන විපක්ෂය වන සජබය ආණ්ඩුවේ වැරදි පෙන්වමින්, ආණ්ඩුව එරෙහිව අධිකරණයට යමින්, ආණ්ඩුව එරෙහිව පාර්ලිමේන්තුව ඇතුළේ සහ ඉන් පිටත විරෝධතා පවත්වමින් සිය කාර්යභාරය ඉටුකරන ආකාරයක් දැකගත හැකිය.

මේ ආකාරයට ආණ්ඩුව සහ විපක්ෂය පැහැදිලිවම වෙන් වෙන්ව සිය දේශපාලන අනන්‍යතා ප්‍රකට කළද, මේ දෙක එක්වූ තැන්ද පසුගිය කාලයේ නැතුවා නොවේ. විශේෂයෙන්ම පසුගිය කාලසීමාවේ ලංකාවට බරපතළ හර්ජනයක් එල්ල කළ දිට්වා සුළි කුණාටුවේදී සජබය සියලු පක්ෂ, පාට භේද අමතුව ජනතාව වෙනුවෙන් ආණ්ඩුවට සහාය දුන් ආකාරයක් දැකගත හැකි විය. මෙහිදී ඇතැමුන් එය හෙළාදැකීමක් 'සජිත් ආණ්ඩුවත් එක්ක ඩීල් දාලා', 'සජිත් පණ නෑ' යනුවෙන් සඳහන් කරමින් සජබයත්, විපක්ෂ නායක සජිත්ගේ දේශපාලන වශයෙන් හැල්ලු කිරීමට කටයුතු කොට තිබූ නමුත් මෑත කාලයේ තුනෙන් දෙකක අතිමහත් බලයකින් ආණ්ඩුව පිහිටුවූ මාලිමාවට හිටපු කතානායකවරයාගේ සිද්ධිය, කන්ටේනර් 323 සිද්ධිය, බාල ගල්අඟුරු ගෙන්වීමේ සිද්ධිය, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ආණ්ඩුව ගන්නා උත්සාහය වැනි සිද්ධීවලදී ආණ්ඩුව එරෙහිව දැවැන්ත ජනතා මතයක් ගොඩනැංවීමට සජිත් සහ සජබය කටයුතු කර තිබූ ආකාරයක් දැකගත හැකි විය.

## සජිත්ගෙන් අනුරට කෝල් එකක්

**මේ සියලු දේශපාලන ගැටුම් මැද පසුගිය සතියේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අතර මුහුණට මුහුණ විශේෂ හමුවක් සිදුවිය. මාධ්‍ය හරහා එය ජනතාවට දැකගැනීමට හැකි වුවද එම සිදුවීම පසුපස කවුරුත් නොදන්නා සිදුවීම් මාලාවක් තිබිණි. ඊට හේතු වූයේ ජාතික ආපදා කළමනාකරණ සභාව රැස්කිරීමට ජනාධිපතිවරයා කටයුතු කොට තිබීමය.**

පසුගිය 30 වැනිදා ජනාධිපති කාර්යාලයේදී පැවැති මෙම සාකච්ඡාවට එම කමිටුව නියෝජනය කරන සියලු සාමාජිකයන්ට ආරාධනා කිරීමට කටයුතු කොට තිබිණි. විපක්ෂ නායක සජිත්ද නිල බලයෙන් එම කමිටුවේ සාමාජිකයෙකි. එමෙන්ම පාර්ලිමේන්තුවේදීත්, ඉන් පිටතදීත් ලංකාව මුහුණ දීමට නියමිත එල්නිනෝ කාලගුණික විපර්යාස සංසිද්ධිය පිළිබඳ පළමුවරට රටට අනාවරණ කිරීමට පියවර ගෙන තිබුණේද සජිත්ය. සාමාන්‍යයෙන් සජිත් සැලකෙන්නේ මෙවැනි ස්වභාවික ආපදා පිළිබඳ අධ්‍යයනය කරන, ඒ සම්බන්ධයෙන් මුලින්ම රට දැනුවත් කරන දේශපාලන නායකයකු ලෙසටය. ඊට හොඳම උදාහරණය වන්නේ කොවිඩ් ව්‍යසනය සහ දිට්වා සුළි කුණාටුවය. ඒ අවස්ථා දෙකේදීම සජිත් කාටත් කලින් ඒ පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවේදී රටට අනාවරණ කරමින් ආණ්ඩුව සහ ජනතාව දැනුවත් කිරීමට පියවර ගෙන තිබිණි.

ඒ අනුව මෙම එල්නිනෝ තත්ත්වය පිළිබඳවද බරපතළ අනාවැකි පළකරමින් සජිත් පාර්ලිමේන්තුවේදී ආණ්ඩුව දැනුවත් කිරීමට කටයුතු කොට තිබිණි. දිට්වා සුළි කුණාටුවේදී සිදුවූ යම් යම් අතපසුවීම් සහ වැරැදි මගහැර ගත යුතු නිසාදෝ ආණ්ඩුව, මේ එනවා යැයි කියන එල්නිනෝ තත්ත්වයේදී පසෙකට වී සිටීමට කටයුතු කළේ නැත. වහාම එල්නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සජිත්ද සාමාජිකත්වය දරන ජාතික ආපදා කළමනාකරණ කමිටුව රැස්කිරීමට ජනාධිපතිවරයා කටයුතු කොට තිබුණේ ඒ අනුවය.

මේ ආකාරයට ජාතික ආපදා කළමනාකරණ කමිටු රැස්වීමට ආරාධනා ලැබීමත් සමග සජබය ඇතුළේ සිටින යම් යම් පිරිස් ඊට සහභාගි නොවන ලෙසට සජිත්ට දැනුම් දී තිබූ ආකාරයක්ද දැකගත හැකි විය. ඔවුන්ගේ තර්කය වී තිබුණේ ආණ්ඩුව මේ වනවිට විපක්ෂය මර්දනය කරමින් සිටින නිසා ඊට විරෝධය පළකරමින් මෙම රැස්වීමට සහභාගි නොවිය යුතු බවය. නමුත් එහිදී සජිත් දැඩි ස්ථාවරයක සිටිමින් කියා සිටියේ රට ජාතික ප්‍රශ්නයකට මුහුණ දීමට නියමිත අවස්ථාවකදී ඒ පිළිබඳ දේශපාලන කෝණයෙන් නොබලා ජනතාවාදී විපක්ෂයක් ලෙස රටක්, ජනතාවක් වෙනුවෙන් කටයුතු කළ යුතු බවය. ඒ අනුව තමන් එම රැස්වීමට සහභාගි වන බව සජිත් එහිදී තමන්ට කතා කළ පිරිසට දැනුම් දීමට පියවර ගත්තේය.

කෙසේ වෙතත් සජිත් මෙම රැස්වීමට හිස් අතින් සහභාගි වීමට සූදානම් වූයේ නැත. ඒ වෙනුවට සජිත් කළේ දින ගණනාවක් තිස්සේම දිවා රෑ නොබලමින් මෙවැනි ජාතික ව්‍යසනයකදී දේශපාලන අධිකාරිය කටයුතු කළ යුත්තේ කෙසේද, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ගතයුතු පියවර මොනවාද, ජනතාවට සහන ලබාදිය යුතු ක්ෂේත්‍ර මොනවාද යන්න පිළිබඳ දීර්ඝ අධ්‍යයනයක නිරත වීමය. විශේෂයෙන්ම සුනාමි ව්‍යසනය, ගංවතුර තත්ත්වය, දිට්වා කුණාටුව, සුනාමි ව්‍යසනය වැනි ජාතික ආපදා තත්ත්වය අධ්‍යයනය කරමින් ඒවාට කල්තියා සූදානම් විය යුතු ආකාරයත්, විසඳුම් යෝජනා මාලාවකුත් එහිදී සකස් කිරීමට සජිත් පියවර ගත්තේය.

නමුත් මෙහිදී මෙම රැස්වීමට සහභාගි වීම සම්බන්ධයෙන් යම් ප්‍රායෝගික ගැටලුවකට මුහුණ දීමට සජිත්ට සිදුවිය. ඒ, සිය බිරිය වූ ජලනි ප්‍රේමදාස මහත්මියගේ පවුලේ ඥාතියකුගේ දානමය පින්කමක් හරියටම රැස්වීම පැවැත්වෙන දින ඒ වෙලාවටම යෙදී තිබීමය. එම දානමය පින්කම සජිත්ගේ නිවසේ පැවැත්වීමට නියමිතව තිබීම නිසා සජිත්ටද ඊට සහභාගි වීමේ අවශ්‍යතාව තිබිණි. ඒ අනුව ජාතික ආපදා කළමනාකරණ රැස්වීමත්, සිය නිවසේ පැවැත්වෙන දානමය පින්කමත් යන දෙකටම සහභාගි වීම අත්‍යාවශ්‍ය නිසා සජිත් කළේ එදින උදෑසනම ජනාධිපතිවරයාට දුරකතන ඇමතුමක් ලබාදීමය. සජිත් ලබාදුන් දුරකතන ඇමතුමට පිළිතුරු දුන්නේද ජනාධිපතිවරයා විසින්මය. ඒ අනුව සජිත් ජනාධිපතිවරයාගෙන් විශේෂ ඉල්ලීමක් සිදුකිරීමට පියවර ගත්තේය.

'ජනාධිපතිතුමනි මම අද අනිවාර්යයෙන්ම ජාතික ආපදා කළමනාකරණ කමිටුවේ මීටින් එකට එනවා. මොකද මේ එල්නිනෝ සිද්ධිය ගැන මුලින්ම පාර්ලිමේන්තුවේ මම කතා කළා. ඒ වගේම මේ ප්‍රශ්නයට මුහුණ දිය යුතු ආකාරය ගැන වාර්තාවක් අපි සකස් කරලා තියෙනවා. හැබැයි මට පොඩි ප්‍රශ්නයක් මතුවෙලා තියෙනවා. මගේ බිරිඳගෙ පැත්තෙන් දානමය පින්කමක් අද උදේ 10.30ටම අපේ ගෙදර සූදානම් කරලා තියෙනවා. ඒකටත් මම අද සහභාගි වෙන්න ඕනේ. ඒ නිසා ඔබතුමාට පුළුවන්ද මම මීටින් එකට ආවාම මගේ ඉදිරිපත් කිරීම කරන්න මුලින්ම මට අවස්ථාව ලබාදෙන්න?' යනුවෙන් සජිත් ජනාධිපතිවරයාගෙන් විමසූ අවස්ථාවේ දෙවතාවක් නොසිතූ ජනාධිපතිවරයාද 'කිසි ප්‍රශ්නයක් නෑ, මම ඒක දෙන්නම්..' යනුවෙන් සජිත්ට දැනුම් දීමට පියවර ගත්තේය.

අතීතයේදී නම් විපක්ෂ නායකවරුන්ගේ මෙවැනි ඉල්ලීම්වලට ජනාධිපතිවරුන් ඉඩ ලබාදෙන්නේ නැත. සාමාන්‍යයෙන් එවැනි රැස්වීම්වලදී සිදුවන්නේ මුලින් ජනාධිපතිවරයා කතාකොට පසුව අගමැතිවරයා කතා කොට ඊටත් පසු ආණ්ඩුවේ මැතිඇමැතිවරුන් පවා කතාකොට අවසන් වීමෙන් පසුව විපක්ෂ නායකවරයාට අවස්ථාව ලබාදීමය. නමුත් මේ අවස්ථාවේදී විපක්ෂයේ සහාය ආණ්ඩුවට අවශ්‍ය බව ජනාධිපතිවරයාට වැටහී ගොස් තිබීම නිසාදෝ රැස්වීමේ පළමුවෙන්ම අදහස් දැක්වීමේ අවස්ථාව විපක්ෂ නායකවරයාට ලබාදීමට ජනාධිපතිවරයා කටයුතු කළේය. ඒ අනුව ඊට ස්තුතිය පළකළ සජිත් නියමිත වෙලාවට රැස්වීමට සහභාගි වූයේ ජනාධිපතිවරයා දුන් පොරොන්දුව ඉටුකරයිද නැද්ද යන්න පිළිබඳ කිසියම් දෙගිඩියාවකින් යුතුවය.

කෙසේ වෙතත් ජනාධිපතිවරයා රැස්වීම ආරම්භ කරමින් සියලු දෙනාටම දැනුම් දී සිටියේ විපක්ෂ නායකවරයාට තවත් අත්‍යාවශ්‍ය කටයුත්තක් යෙදී ඇති බැවින් සාකච්ඡාවේ පළමු අදහස් දැක්වීමේ අවස්ථාව ඔහුට ලබාදෙමු යැයි කියාය. ඒ අනුව ඊට ස්තුතිය පළකළ සජිත්, එල්නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් සහ ඊට මුහුණ දියයුතු ආකාරය සම්බන්ධයෙන් රැස්ව සිටි පිරිස් මවිතයට පත්කරමින් සිය අදහස් දැක්වීම සිදුකළ ආකාරයක් දැකගත හැකි විය.

## මෙන්න කියපු දේවල්

**රටට තීරණාත්මක මොහොතක ජාතික ආපදා කළමනාකරණ සභාව කැඳවීම පිළිබඳව ජනාධිපතිවරයා වෙත සිය කෘතඥතාව පළ කරමින් සජිත් සිය අදහස් දැක්වීම ආරම්භ කළේය. ආපදා සූදානම්කාරීත්වය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව යනු දේශපාලන භේදයන්ගෙන් ඔබ්බට ගිය සහ සාමූහික ජාතික ප්‍රතිචාරයක් අවශ්‍ය වන ජාතික වගකීම් බව ඔහු අවධාරණය කළේය.**

'අපගේ ජනතාවගේ ජීවිත, ජීවනෝපායන් සහ ආරක්ෂාව අවදානමට ලක්ව ඇති විට, තිබිය යුත්තේ එකම එක පාර්ශ්වයක් පමණි, එය ශ්‍රී ලංකාවයි.' යනුවෙන් කී සජිත්, දේශගුණික විපර්යාස හේතුවෙන් මතුවන වර්ධනය වන අවදානම් සඳහා ශ්‍රී ලංකාවේ සූදානම්කාරිත්වයට දායක වීමේ ඒකායන අරමුණින් යුක්තව, සිය නිරීක්ෂණ, ජාතික සමගිය සහ නිර්මාණාත්මක සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද බව සඳහන් කළේය.

නවතම ගෝලීය විද්‍යාත්මක තක්සේරු කිරීම් පිළිබඳව සඳහන් කරමින් විපක්ෂ නායකවරයා පෙන්වා දුන්නේ වර්ධනය වෙමින් පවතින 2026-2027 එල් නිනෝ තත්ත්වය මෑත දශක කිහිපය තුළ ඇතිවූ ප්‍රබලම තත්ත්වයක් බවට පත්විය හැකි බවයි. එමගින් දීර්ඝකාලීන නියඟයක් සහ ඉන් පසුව දරුණු ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ සම්භාවිතාව ඉහළ නංවන අතර, දේශගුණ විද්‍යාඥයින් විසින් මෙය 'දේශගුණික කස පහරක්' ලෙස වඩ වඩාත් විස්තර කර ඇති බව පෙන්වා දුන්නේය. මෙම බලපෑම් ඇති වීමට පෙර ජාතික සූදානම්කාරීත්වය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇත්තේ සීමිත කාලපරිච්ඡේදයක් පමණක් බවද ඔහු අවධාරණය කළේය.

දිට්වා සුළි කුණාටුව සහ අනෙකුත් මෑතකාලීන ආපදාවලින් උගත් පාඩම් පිළිබඳ ආවර්ජනය කරමින් සජිත් කියා සිටියේ, ආපදා සිදුවූ පසු ඒවාට ප්‍රතිචාර දැක්වීමේ පිළිවෙතක් මත පමණක් ශ්‍රී ලංකාවට තවදුරටත් විශ්වාසය තැබිය නොහැකි බවයි. ඒ වෙනුවට, විද්‍යාත්මක පුරෝකථන, අවදානම් තක්සේරු කිරීම් සහ පූර්ව සූදානම මගින් ජාතික තීරණ ගැනීම මෙහෙයවනු ලබන පෙරහුරු පාලනයක් හෙවත් අවදානම් අපේක්ෂා කරන්නාවූ පාලනයක් කරා ක්‍රමයෙන් පරිවර්තනය වීමේ අවශ්‍යතාව ඔහු අවධාරණය කළේය.

තමාගේ මෙම අදහස් දැක්වීම රජය විවේචනය කිරීමක් හෝ රාජ්‍ය ආයතන විසින් දැනටමත් සිදු කරනු ලබන වටිනා කාර්යයන් අනුපිටපත් කිරීමට ගත් උත්සාහයක් නොවන බව මෙහිදී අවධාරණය කළ සජිත්, ඒ වෙනුවට, අනාගත දේශගුණික ආපදාවලට ශ්‍රී ලංකාවේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා රජයට සහ සියලු අදාළ ආයතනවලට සහාය විය හැකි පරිදි ජාත්‍යන්තර සාක්ෂි, විද්‍යාත්මක තක්සේරු කිරීම් සහ ප්‍රායෝගික ප්‍රතිපත්ති නිර්දේශයන් එකඟතා සහිත උපායමාර්ගික රාමුවකට ගෙන එමින් ජාතික ප්‍රතිපත්ති සාකච්ඡාවලට නිර්මාණාත්මකව දායක වීම මෙහි අරමුණ බව පැවැසීය.

එහිදී විපක්ෂ නායකවරයා මූලික පණිවුඩ තුනක් ඉස්මතු කළේය.

පළමුවෙන්ම, ආපදා සිදුවීමට පෙර කරනු ලබන ආයෝජන මගින් ජීවිත බේරාගන්නා බවත්, ජීවනෝපායන් ආරක්ෂා කරන බවත්, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කරන බවත් සඳහන් කරමින්, පෙරහුරු පාලනය ජාතික ආපදා කළමනාකරණයේ මූලික පදනම විය යුතු බව සජිත් පෙන්වා දුන්නේය.

දෙවනුව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සමස්ත රජයේම වගකීමක් විය යුතු බවත්, ඒ සඳහා කෘෂිකර්ම, ජල සම්පත්, බලශක්ති, සෞඛ්‍ය, මුදල්, ආරක්ෂක, පළාත් පාලන සහ පළාත් සභා යන ක්ෂේත්‍රවලට වගකිව යුතු ආයතන අතර සමීප සම්බන්ධීකරණයක් අවශ්‍ය වන බවත් සජිත් අවධාරණය කළේය.

තෙවැනුව, ආහාර සුරක්ෂිතතාව, ජල ආරක්ෂණය, බලශක්ති සුරක්ෂිතතාව, මහජන සෞඛ්‍යය, යටිතල පහසුකම්, ජෛව විවිධත්වය සහ මූල්‍ය ස්ථාවරත්වය එකිනෙකට සමීපව සම්බන්ධ වී ඇති බැවින්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාවෙන් වෙන් කළ නොහැකි බවත්, එබැවින් ඒවාට ඒකාබද්ධ ජාතික ප්‍රතිපත්ති රාමුවක් හරහා ආමන්ත්‍රණය කළ යුතු බවත් සජිත් සිය කතාවේදී පෙන්වා දුන්නේය.

එහිදී සජිත් ඉස්මතු කරන ලද ප්‍රමුඛතා ක්ෂේත්‍ර අතර පහත ක්ෂේත්‍ර අන්තර්ගත විය.

- ජාතික දේශගුණික සූදානම්කාරීත්වය සහ පෙරහුරු හෙවත් ආපදා අපේක්ෂිත පාලනය ශක්තිමත් කිරීම,
- ඒකාබද්ධ ජලාශ කළමනාකරණය තුළින් ජල ආරක්ෂණය වැඩි දියුණු කිරීම,
- ආහාර සුරක්ෂිතතාව සහ දේශගුණිකව-සුහුරු කෘෂිකර්මාන්තය නංවාලීම
- බලපෑම් පාදක කරගත් පුරෝකථනයන් මගින් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති නවීකරණය කිරීම
- ආපදා අවදානම් මූල්‍යකරණය ශක්තිමත් කිරීම
- උෂ්ණත්ව තරංග හෙවත් තාප තරංග සහ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි හදිසි අවස්ථා සඳහා සූදානම වැඩිදියුණු කිරීම
- තීරණාත්මක යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව නංවාලීම සහ
- රජය පුරා සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීමට සහාය වීම සඳහා ජාතික දේශගුණික අවදානම් සහ ආපදා බුද්ධි තොරතුරු මධ්‍යස්ථානයක් (National Climate Risk and Disaster Intelligence Centre) පිහිටුවීම කෙරෙහි අවධානය යොමුකිරීමය.

දේශගුණික අවදානම්වලට වැඩි වශයෙන් නිරාවරණය වන රටවල් පෙරහුරු පාලනය, ඒකාබද්ධ දේශගුණික බුද්ධි තොරතුරු සහ විද්‍යාව පදනම් කරගත් සැලසුම්කරණය සඳහා ආයෝජනය කරමින් සිටින බව පෙන්වා දුන් සජිත්, ශ්‍රී ලංකාවට තමන්ගේම ජාතික තත්ත්වයන්ට ගැළපෙන විසඳුම් සංවර්ධනය කිරීමේදී වටිනා පාඩම් උගත හැකි උදාහරණ ලෙස, ඉන්දියාවේ ශක්තිමත් කරන ලද දේශගුණික පුරෝකථන සහ කෘෂිකාර්මික හදිසි සැලසුම්කරණය මෙන්ම ඔස්ට්‍රේලියාව වැනි රටවල ක්‍රියාත්මක කරන ලද පුළුල් ඔරොත්තු දීමේ මුලපිරීම් පිළිබඳ සඳහන් කළේය.

දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව රජයට පමණක් තනිවම ළඟා කරගත නොහැකි බවද සජිත් එහිදී ජනාධිපතිවරයා ඇතුළු පිරිසට අවධාරණය කළේය. ඒ සඳහා පාර්ලිමේන්තුව, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විද්‍යාත්මක හා ශාස්ත්‍රීය ප්‍රජාව, විශ්වවිද්‍යාල, පෞද්ගලික අංශය, සිවිල් සංවිධාන, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සහ දේශීය ප්‍රජාවන් අතර සමීප සහයෝගිතාවක් අවශ්‍ය සජිත් පෙන්වා දුන්නේය.

2026-2027 එල් නිනෝ - දක්ෂිණ දෝලන චක්‍රයෙන් එල්ල වන ක්ෂණික අභියෝගවලින් ඔබ්බට බලමින්, ජාතික දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ආපදා සූදානම්කාරීත්වය පිළිබඳ විස්තීර්ණ ජනාධිපති ධවල පත්‍රිකාවක් සකස් කිරීම කෙරෙහි ශ්‍රී ලංකාවේ අවධානය යොමුකළ හැකි බවද කී සජිත් එවැනි ලේඛනයකට, තනි පාලන තන්ත්‍රයන්ගෙන් ඔබ්බට යන සහ අනාගත පරපුර උදෙසා පැහැදිලි ජාතික මග පෙන්වීමක් ස්ථාපිත කරන දිගුකාලීන, සමස්ත රාජ්‍යය අන්තර්ගත ප්‍රතිපත්ති රාමුවක් සැපයිය හැකි බව පැවසීය.

දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂිත, වඩාත් ඔරොත්තු දෙන සහ වඩාත් සන්නද්ධ ශ්‍රී ලංකාවක් උදෙසා රජය, පාර්ලිමේන්තුව, විද්‍යාත්මක ප්‍රජාව, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය එක්සත් කළ හැකි ජාතික න්‍යාය පත්‍රයක් බවට පත්වනු ඇතැයි තමා විශ්වාස කරන බවද සජිත් එහිදී ප්‍රකාශ කළේය.

කෙසේවෙතත් සිය අදහස් දැක්වීම අවසන් කරමින් ප්‍රේමදාස මහතා නැවතත් අවධාරණය කළේ දේශගුණික විපර්යාසයන් රජය සහ විපක්ෂය අතර වෙනසක් නොදකින බවත්, ගංවතුර, නියඟ හෝ උෂ්ණත්ව තරංග දේශපාලන අනුබද්ධතාවන් මත වෙනස් නොවන බවත්ය.

'දේශගුණික විපර්යාස රජය සහ විපක්ෂය අතර වෙනස දන්නේ නෑ. ගංවතුර දේශපාලන පක්ෂ අනුව වෙනස් වෙන්නෙ නෑ. නියඟය සෑම ගොවියෙකුටම බලපානවා. උෂ්ණත්ව තරංග සෑම පවුලකටම බලපානවා. ඒ නිසා අපගේ ජනතාව ආරක්ෂා කිරීම සියල්ලන් හවුල් වී සිදුකළ යුතු පොදු ජාතික වගකීමක්..' යනුවෙන් සජිත් සඳහන් කළේය.

සාකච්ඡාව අතරතුර ගෙනහැර දැක්වූ අදහස් සහ නිර්දේශ ජාතික ආපදා කළමනාකරණ සභාවේ සාකච්ඡා සඳහා නිර්මාණාත්මකව දායක වනු ඇති බවටත්, ශ්‍රී ලංකාවේ සූදානම්කාරිත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට දැනට පවතින ජාතික උත්සාහයන්ට සහාය වනු ඇති බවටත් සිය අදහස් දැක්වීම අවසන් කරමින් සජිත් පෙන්වා දුන්නේය.

ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවිත, ජීවනෝපායන් සහ අනාගත සමෘද්ධිය ආරක්ෂා කරන සෑම මුලපිරීමකටම සහාය වීමට තමන් සූදානම් බව සජිත් නැවතත් ස්ථිර කළ අතර, දේශගුණික විපර්යාස සඳහා රටේ ප්‍රතිචාරය විද්‍යාව මගින් මෙහෙයවිය යුතු බවත්, ජාතික සමගිය තුළින් ශක්තිමත් කළ යුතු බවත්, දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණය මගින් තිරසරව පවත්වා ගත යුතු බවත් අවධාරණය කළේය.

මේ ආකාරයට අදහස් ප්‍රකාශ කොට විපක්ෂ නායකවරයා සියලු දෙනාගෙන්ම අවසර ගෙන රැස්වීමෙන් පිටව යෑමට පියවර ගත්තේය. කෙසේ වෙතත් එහිදී සජිත් දැක්වූ අදහස් සම්බන්ධයෙන් සියලු දෙනාම හොඳ තැනක සිටි ආකාරයක් ඔවුන්ගේ මුහුණුවල ඉරියව්වලින් දැකගත හැකි විය. එමෙන්ම ආණ්ඩුවේද අදහස වී තිබුණේ ජාතික ව්‍යසනයක් හමුවේ විපක්ෂ නායකවරයාගේ හැසිරීම ඉතා ප්‍රශස්ථ මට්ටමක ඇති බවකි. එමෙන්ම මෙය හොඳ දේශපාලන ප්‍රවණතාවක් බවද පක්ෂ - විපක්ෂ සියලු දෙනාගේම අදහස වී ඇත.

## වමේ ජවිපෙට වෙච්ච දෙයක්

**ජවිපෙ සහ මාලිමාව එක්ව පසුගිය මැතිවරණයෙන් අතිවිශිෂ්ට බලයක් ලබා ආණ්ඩු පිහිටුවද්දී මුළු රටම සිතා සිටියේ ලංකාවේ පළමු වරට ප්‍රබලම වාමාංශික ආණ්ඩුව ඔවුන් විසින් පිහිටුවා ඇතැයි කියාය. එමෙන්ම ලොව දැනට සිටින ප්‍රබලම වාමාංශික රට වන චීනය සමග අතිසමීප සබඳතාවක් පවත්වාගෙන යනු ඇතැයි කියාය. අතීතයේ සිටම ජවිපෙ චීනය සමග සමීප සබඳතාවක් පවත්වාගෙන යෑම නිසා චීනයේද සහාය ගෙන ප්‍රබල වාමාංශික රටක් බිහිකරනු ඇතැයි කියාය. චීන කොමියුනිස්ට් පක්ෂය සමග සමීප සබඳතා පවත්වා ජවිපෙද ඊට සම්බන්ධ කරනු ඇතැයි කියාය.**

නමුත් මේ වනවිට එම තත්ත්වයේ කිසියම් වෙනසක් සිදුව තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් බොහෝ දෙනා ප්‍රශ්න මතුකරන්නට පටන් ගත්තේ පසුගිය සතියේ කොළඹදී පැවැති චීන කොමියුනිස්ට් පක්ෂයේ 105 වැනි සංවත්සරයේදී සිදුවූ යම් යම් සිදුවීම් හේතුකොට ගෙනය.

පසුගිය කාලයේ පැවැති ආණ්ඩු කිහිපයක්ම චීනය සමග ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන ගියේය. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මහතාගේ සමයේදී චීනය සමග පැවැතියේ අතිසමීප සබඳතාවකි. මහින්දගෙන් පසු බලයට පැමිණි මෛත්‍රීපාල සිරිසේනද චීනය සමග සමීප සබඳතාවක් පවත්වාගෙන ගියේය. මේ රජයයන් දෙක පැවැති කාලසීමාවන්වලදීද චීනය සිය කොමියුනිස්ට් පක්ෂයේ සංවත්සරයන් සැමරීමට කටයුතු කොට තිබූ අතර, එහිදී පවතින රජයටත්, බලයේ සිටින ජනාධිපතිවරයාටත් ප්‍රමුඛ ස්ථානය ලබාදීමට පියවර ගෙන තිබිණි. එමෙන්ම ප්‍රධාන දේශනය ආණ්ඩුවේ සිටින වමට බර චරිතයකට ලබාදීමද සාමාන්‍යයෙන් දැකගන්නට ලැබුණු සිදුවීමකි.

නමුත් මෙවර චීන කොමියුනිස්ට් පක්ෂ සංවත්සරයේදී දැකගන්නට ලැබුණේ ඊට හාත්පසින්ම වෙනස් සිදුවීම් මාලාවකි. තුනෙන් දෙකක බහුතරයක් ඇති වාමාංශික පාලනයක් මෙරට තහවුරු වී තිබුණද මෙවර චීනය සිය පක්ෂ සංවත්සරයේදී වැඩි තැනක් ලබාදී තිබුණේ මාලිමා ආණ්ඩුවට නොව සිය පක්ෂ ස්ථාවරයන්ට සම්පූර්ණයෙන්ම පටහැනි දක්ෂිණාංශික කඳවුර, දකුණු ඉවුර, මානුෂීය ධනවාදය සිය ස්ථාවරය කොටගත් සජිත් ප්‍රමුඛ සමගි ජන බලවේගයටය. මෙරට චීන තානාපති කාර්යාලය මගින් සජිත්ට ඊට සහභාගි වන ලෙස ආරාධනා කරද්දීම දැනුම් දීමට කටයුතු කොට තිබුණේ විශේෂ ආරාධිතයකු ලෙස මෙහිදී සජිත්ට දේශනයක් ලබාදීමටද පියවර ගෙන ඇති බවකි.

ඒ අනුව චීන තානාපති කාර්යාලය ජනාධිපතිවරයාටද එම උත්සවයට ආරාධනා කොට තිබුණද කලින් යොදාගත් රාජකාරි කිහිපයක් හේතුවෙන් ජනාධිපතිවරයා ඊට සහභාගි වූයේ නැත. ඒ වෙනුවට ආණ්ඩුව නියෝජනය කරමින් ඊට සහභාගි වී සිටියේත්, කතාවක් කළේත් ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වාය. ටිල්වින් සිල්වා සිය කතාව කොළයක් බලාගෙන සිංහලෙන් කරද්දී සජිත් කිසිදු කොළයක් නොබලා ව්‍යක්ත ඉංග්‍රීසි භාෂාවක් යොදාගනිමින් සිදුකළ දේශනය මෙහිදී සියලු දෙනාගේම අවධානයට ලක්විය. විශේෂයෙන්ම සජිත් සිය කතාවේදී චීන යෙදුම් යොදාගැනීම සම්බන්ධයෙන් චීන තානාපතිවරයා මෙන්ම අනෙකුත් නිලධාරීන්ද සජිත්ට ප්‍රශංසා මුඛයෙන් කතාකළ ආකාරයක් දැකගන්නට ලැබිණි. මෙහිදී දක්නට ලැබුණු අනෙක් විශේෂම සිදුවීම වූයේ සජිත් කතාව ආරම්භ කරද්දීම ජවිපෙ ලේකම් ටිල්වින් සිය අසුනෙන් නැගිට සභාවෙන් පිටව යාමය.

කෙසේවෙතත් චීනය සමග එදා සමීපව කටයුතු කළ හිටපු ජනාධිපතිවරුන් වන මහින්දත්, ගෝඨාභයත් එම අවස්ථාවට එක්ව සිටියද නාමල් රාජපක්ෂ සහභාගී නොවීම කැපී පෙනෙන සිදුවීමක් විය. නමුත් පොහොට්ටුව වෙනුවෙන් කතාවක් කිරීම බාරව තිබුණේ පක්ෂ ලේකම් සාගර කාරියවසම්ටය. මෙහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ සාමාන්‍යයෙන් ඉහළ පෙළේ නිල උත්සවයක් යන්න පසෙක තබා සාගර සිය කතාවේදී ජවිපෙ ආණ්ඩුවට ප්‍රබල දේශපාලන ප්‍රහාරයක් එල්ල කර සිටීමය.

'අපේ ආණ්ඩුව කාලෙ තමයි චීනයත් එක්ක සමීපව කටයුතු කරමින් දැවැන්ත සංවර්ධනයක් රටට අරන් ආවේ. චීනයේ ආධාර ඇතිව අපි දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකළා. හම්බන්තොට වරාය ඉදිකළා. මත්තල ගුවන් තොටුපොළ ඉදිකළා. හැබැයි අපි මේවා කරද්දි එ කාලේ විපක්ෂයේ හිටපු ජවිපෙ මන්ත්‍රීවරු අපි හොරකම් කරනවා කියලා ලොකු චෝදනාවක් එල්ල කළා. අද ඒ ජවිපෙ ආණ්ඩුව අරගෙන අපි කරපු දේම කරගෙන යනවා...' යනුවෙන් කියමින් සාගරද ඉංග්‍රීසි භාෂාවෙන් සිය අදහස් පළකිරීම සිදු කළේය.

ඉන් අනතුරුව එජාපය වෙනුවෙන් කතා කිරීම බාරව තිබුණේ වජිර අබේවර්ධනටය. වජිරද කොළයක් බලාගෙන ඉංග්‍රීසි භාෂාවෙන් කතා කළද ඒ කතාවට කිසිවෙකුත් සවන් දෙන ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත. කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් අදහස් දැක්වූයේ පක්ෂ මහලේකම් වීරසුමන වීරසිංහය.

## ප්‍රේමදාසලාගේ චීන යාළුකම

**සජිත් සහ චීනය අතර සබඳතා පැවැතියේ අද ඊයේක සිට නොව, සජිත්ගේ පියා වූ රණසිංහ ප්‍රේමදාස මහතා අගමැතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේ සිටමය. රණසිංහ ප්‍රේමදාස අගමැතිවරයා වශයෙන් කටයුතු කරද්දී ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනට විශාල වශයෙන් උදව් කළේ ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය සහ ස්කැන්ඩිනේවියානු රටවල්ය. එහිදී චීනය සමග ගනුදෙනු කරමින් චීන ආධාර ලංකාවට ලබාගැනීමට කටයුතු කළේ අගමැති ප්‍රේමදාසය. මේ නිසා චීනය සහ ප්‍රේමදාස පවුල අතර විශේෂ සබඳතාවක් අතීතයේ සිටම ගොඩනැඟී තිබුණි.**

2001 වසරේ එජාප ආණ්ඩුව පිහිටුවීමෙන් පසු අන්ත දක්ෂිණාංශික නායකයකු ලෙස කටයුතු කළ රනිල් වික්‍රමසිංහට වරෙක චීනයට යෑමට අවස්ථාව උදාවී තිබිණි. එහිදී චීනය බැලන්ස් කරගෙන එරටින් ආධාර උපකාර ලබාගැනීම සඳහා එවක නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කළ සජිත්වද සිය සංචාරයට එක්කර ගැනීමට රනිල් කටයුතු කළේය. එම සංචාරයේදී රනිල් ගොඩ ගියේ චීනයට සජිත්ව පෙන්වමින්ය.

කෙසේවෙතත් ඒ සබඳතා නිසා සජිත්ට චීන කොමියුනිස්ට් පක්ෂ සංවත්සර උත්සවයට ආරාධිත දේශනයක් කිරීමට අවස්ථාව දීමට චීනය පියවර ගත්තාද, එසේත් නැතිනම් දුරදිග බලා ඉදිරියේදී සිදුවීමට නියමිත දේශපාලන පෙරළි පිළිබඳ සිතාබලා චීනය සජිත්ට ආරාධනා කළාද යන්න සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරු නැතත්, මෙම උත්සවයේදී අන් කවරෙකුටත් වඩා සජිත්ට අවස්ථාව ලබාදීමට චීනය කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය. අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ චීනය සජිත්ට ලබාදුන් මේ තැන නිසා උත්සවයට සහභාගි වී සිටි මාලිමා මැති ඇමැතිවරුන්ගේ සිත්වල පවා ප්‍රශ්නාර්ථයක් මතුව තිබූ බවකි. එය ඉදිරියේදී සිදුවීමට නියමිත විශාල පෙරළියක ආරම්භයක් මෙන්ම මාලිමාවට චීනයෙන් ලබාදුන් නිහඬ අනතුරු ඇඟවීමක්

රාජ්‍ය රහස්

# සජිත්ගේ කතාවට සභාවම හොල්මන්

කපිල පුංචිමාත්තගේ

රාජ්‍ය රහස්



බව බොහෝ දෙනාගේ මතය වී තිබිණි.

ඒ අනුව ලංකාවේ වාමාංශික පක්ෂයක් බලයට පත්ව සිටියදීත් චීනය මේ ආකාරයෙන් ඊට වැඩි බරක් නොතබා මානුෂීය ධනවාදය අගය කරන සජිත්ට සහ සජබයට වැඩි තැනක් ලබාදීමට කටයුතු කළේ ඇයි? මේ සම්බන්ධයෙන් තොරතුරු සෙවීමේදී අපට දැනගන්නට ලැබුණේ වාමාංශික යැයි කියන මාලිමා ආණ්ඩුව චීනයට ලබාදී තිබූ පොරොන්දු කඩකිරීම මෙම තත්ත්වයට හේතුවී ඇතැයි කියාය. සාමාන්‍යයෙන් බොහෝ දෙනා සිතුවේ මාලිමාව සහ ජවිපෙ බලයේ සිටියදී චීනය විශාල වශයෙන් ලංකාවේ ආයෝජන කටයුතු සිදුකරනු ඇතැයි කියාය. එය තහවුරු කරමින් මුලින්ම ලංකාවට ආධාර උපකාර කිරීමට ඉදිරිපත් වූයේද චීනයය. විශේෂයෙන්ම ජනාධිපතිවරයා මුලින්ම සිදුකළ චීන සංචාරයේදී ගිවිසුම් රැසකට අස්සන් තැබූ අතර, අතිදැවැන්ත ආයෝජන ව්‍යාපෘතිවලටද අස්සන් තැබිණි. ඩොලර් මිලියන 5 ඉක්මවා යන හම්බන්තොට තෙල් පිරිපහදුව මෙන්ම තවත් ආයෝජන ව්‍යාපෘති රැසක් ලංකාවේ සිදුකිරීමටද චීනය එකඟතාව පළ කළේය. එහිදී චීනය පැත්තෙන් ඉදිරිපත්ව තිබුණේ එකම එක කොන්දේසියක් පමණි. ඒ, රනිල් වික්‍රමසිංහ පාලන සමයේදී තහනම් කරනු ලැබූ චීන පර්යේෂණ නෞකාවන්ට නැවත ලංකා මුහුදු සීමාවට ඇතුළු වී පර්යේෂණ කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස පමණි. එහිදී ජනාධිපතිවරයාද ඊට යහපත් ප්‍රතිචාරයක් දක්වමින් එම තහනම ඉවත් කරන බවට චීනයට දැනුම්දී තිබූ අතර, ඊට අදාළ ගිවිසුම් සංශෝධනය කොට කඩිනමින් යළි සකස් කිරීමට කටයුතු කරන බවටද දැනුම්දී තිබිණි.

නමුත් එම සංචාරය අවසන් වී මේ වනවිට වසර දෙකකට ආසන්න කාලයක් ගතව තිබුණද, තවමත් ඊට අදාළ ගිවිසුම ආණ්ඩුව පැත්තෙන් එළියට දැමීමට කටයුතු කොට නැත. අවස්ථා ගණනාවකදීම චීනය මේ පිළිබඳ ලංකා ආණ්ඩුවට සිහි කැඳවීම් කළද, විවිධ කරුණු ඉදිරිපත් කරමින් ආණ්ඩුව එය මගහැර සිටි ආකාරයක් දැකගත හැකි විය. විශේෂයෙන්ම ජනාධිපතිවරයා විසින් කමිටුවක් පත්කොට ඒ කමිටුව හරහා මෙම ගිවිසුම සකස් කොට අවසන් කර තිබුණද, එය එළියට නොදැමීමට ආණ්ඩුව තීරණය කොට තිබිණ. ඒ අනුව අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ ආණ්ඩුව ගෙන ඇති මෙම තීන්දුව මීට සති දෙකකට පෙර චීනයටද සහතික කොට දැනගන්නට ලැබී ඇති බවකි. ඇතැම් විට චීනය සිය කොමියුනිස්ට් පක්ෂ සංවත්සරයේදී ආණ්ඩුවට වඩා විපක්ෂයට තැන ලබාදීමට පියවර ගෙන තිබුණේ එම තොරතුර වාර්තා වීමෙන් පසුව විය යුතුය.

## මහින්දගේ අනුප්‍රාප්තිකයා

**මේ අතර පසුගිය සතියේ අප 'රාජ්‍ය රහස්' තීරයෙන් විශේෂ අනාවරණයක් සිදුකරමින් කියා සිටියේ ඇමෙරිකානු නියෝජිතයන් කොළඹ වරායේත්, හම්බන්තොට මත්තල ගුවන් තොටුපළේත්, ත්‍රිකුණාමල වරායේත්, දැවැන්ත ආයෝජන සිදුකිරීමට සැලසුම් කරමින් සිටින බවකි. ඒ හරහා නාවික ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ ව්‍යාපෘති රැසක් දියත් කිරීමට ඇමෙරිකාව සැලසුම් කරමින් සිටින බව එහිදී අප සඳහන් කර සිටියෙමු. ඒ අනුව මේ සතිය වනවිට අපට ලැබී ඇති තොරතුරුවලින් කියවෙන්නේ එම ආයෝජන ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරයන් ආරම්භ කිරීමට මේ වනවිටත් ඇමෙරිකාව කටයුතු කරමින් සිටින බවකි.**

එමෙන්ම ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වන මහින්ද සමරසිංහ මහතා සම්බන්ධයෙන්ද පසුගිය කාලයේ විශේෂ තොරතුරු කිහිපයක්ම මෙම තීරයෙන් වාර්තා කිරීමට අප කටයුතු කළෙමු. එහිදී අප කියා සිටියේ ගෝඨාභය රාජපක්ෂ, රනිල් වික්‍රමසිංහ, අනුර කුමාර දිසානායක යන ජනාධිපතිවරුන් තිදෙනකු යටතේ විශිෂ්ට රාජ්‍යතාන්ත්‍රිකයකු ලෙස ලංකාව මුල්කරගෙන විශිෂ්ට රාජ්‍යතාන්ත්‍රික මෙහෙවරක් ඉටුකළ මහින්ද සමරසිංහ සිය සේවය අවසන් කිරීමට තවත් කල් තිබියදී මෙම මස 31 වැනි දින වනවිට තනතුරෙන් ඉවත් වීමට තීරණය කොට ඇති බවකි. ඊට අදාළ සිය ඉල්ලා අස්වීමේ ලිපියද විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකර තිබූ බවක් අප වාර්තා කර සිටියෙමු. ඒ අනුව මෙවර අප වාර්තා කිරීමට සූදානම් වන්නේ එම ලිපිය ලැබී බොහෝ කලකට පසු මෙරට විදේශ කටයුතු අමාත්‍යාංශය අදාළ ලිපිය පිළිගත් බවට දැනුම් දීමට පියවර ගෙන ඇති බවය. ඒ අනුව එය වොෂින්ටනයට දැනුම් දීමටද විදේශ කටයුතු අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ අනුව පසුගිය කාලයේදී ආණ්ඩුවට විශාල ප්‍රශ්නයක් වී තිබුණේ ලංකාව වෙනුවෙන් විශිෂ්ට සේවාවක් කළ මහින්ද සමරසිංහගේ ඉල්ලා අස්වීමෙන් පසු ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත්කරන්නේ කවුරුන්ද යන්න සම්බන්ධයෙනි. ඒ අනුව මේ වනවිට ජනාධිපතිවරයාද මෙම තීරණාත්මක තනතුර සඳහා පත්කිරීමට සුදුසු පුද්ගලයකු සොයාගෙන අවසන් බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ඒ අනුව අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ ජනාධිපතිවරයා සමීපයේ කටයුතු කරන, ජනාධිපතිවරයාට කිට්ටුම අයෙකු එම තනතුරට පත්කිරීමට ජනාධිපතිවරයා තීරණය කොට ඇති බවකි. තමන්ට විශ්වාසවන්තම හිතවතෙකු එම තනතුරට පත්කිරීම හරහා ඇමෙරිකාව සහ තමන් අතර විශේෂ සබඳතාවක් ගොඩනගා ගැනීමටද මෙහිදී ජනාධිපතිවරයා සැලසුම් කරමින් සිටින බවක්ද ආරංචිය.

## මූල්‍ය අරමුදලේ රතු එළිය

**පසුගිය සතියේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් පිරිසක් ශ්‍රී ලංකාවේ විශේෂ සංචාරයක නිරත වී ජනාධිපතිවරයා හමුවීමෙන් පසු මාධ්‍ය හමුවකට පෙනී සිටීමට පියවර ගත්තේය. එහිදී බරපතළ ආර්ථික ආපදා කිහිපයකින් පසුව ලංකාව නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට පත්වෙමින් සිටින බවට ප්‍රශංසාත්මක මුඛයෙන් අදහස් දැක්වීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් කටයුතු කොට තිබිණි.**

මේ ආකාරයට රටටම දැනෙන්නට ලංකාවේ ආර්ථිකය පිළිබඳ අදහස් ප්‍රකාශ කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් ලංකාවෙන් නික්ම ගිය පසු ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් සකස් කළ අවසන් වාර්තාව ප්‍රසිද්ධියට පත්කිරීමට පියවර ගත්තේය. එහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ ලංකාවේ සිටියදී මෙරට ආර්ථිකය පිළිබඳ මහ ඉහළින් කතා කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් පසුව නිකුත් කළ වාර්තාව හරහා ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් බරපතළ අනතුරු ඇඟවීම් ගණනාවක්ම සිදුකොට තිබීමය. ඒ අනුව බොහෝ දෙනාගේ අදහස වී තිබුණේ ලබන මාර්තු මාසයෙන් පසු ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග අත්සන් කළ ගිවිසුමෙන් ඉවත් වීමට ගෙන ඇති තීන්දුවට අප්‍රසාදය පළ කිරීමක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් හිතාමතාම මේ ආකාරයේ ගේමක් ගැසුවා යැයි කියාය. ඒ අනුව ඔවුන් සිය වාර්තාව මගින් ලංකාව ගැන පළකොට තිබුණේ මෙවැනි ස්ථාවරයකි.

'ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රසිද්ධියේ ප්‍රශංසා කළද, රටේ දිගුකාලීන පැවැත්ම තීරණය කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ දේශපාලන හේතු මත ප්‍රමාද නොකරන්නැයි ඔවුන් රජයට දැඩි ලෙස බලකර සිටී.

කොළඹ පැවැති සතියක සමාලෝචන මෙහෙයුමකින් පසු මූල්‍ය අරමුදලේ මෙහෙයුම් ප්‍රධානී එවන් පැපගෙ 'ඕජියු මහතා පෙන්වා දෙන්නේ මතුපිටින් පෙනෙන යථා තත්ත්වයට පත්වීමට යටින් තවමත් බරපතළ අවදානම් පවතින බවයි.

**සහන මල්ල ගැන දුන් රහසිගත පණිවිඩය**

මැදපෙරදිග දේශපාලන අර්බුදය හමුවේ ඉන්ධන, විදුලිය, පොහොර සහනාධාර සහ අස්වැසුම වැනි සෘජු මුදල් හුවමාරු හරහා ජනතාවට සහන දීමට රජය ප්‍රතිපත්තිමය නම්‍යශීලීභාවය භාවිත කිරීම අයිඑම්එෆ් ඇගයීමට ලක් කර ඇත.

**දැඩි කොන්දේසිය**

මෙම සහන පියවර සියල්ල අනිවාර්යයෙන්ම 'තාවකාලික' විය යුතු බවට ඔවුන් රජයට රහසිගතව දැනුම් දී තිබේ.

**ඉලක්කය**

2027 වනවිට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2.3%ක ප්‍රාථමික අයවැය අතිරික්ත ඉලක්කය සපුරා ගැනීමට නම් මූල්‍ය විනය වහාම තහවුරු කළ යුතුය. දේශපාලන වාසි තකා දිගින් දිගටම හදිසි වියදම් කළහොත් ණය අර්බුදයෙන් ගොඩ ඒමට ගත් දැඩි උත්සාහයන් සියල්ල වතුරේ යනු ඇත.

**පද්ධතිය කඩාවැටීමේ මුල් ලකුණු**

මූල්‍ය අරමුදලේ මෙම අනතුරු ඇඟවීම් තහවුරු කෙරෙන ආර්ථික දර්ශක කිහිපයක් මේ වන විටත් මෙරට ආර්ථිකයෙන් මතුවෙමින් පවතී.

**උද්ධමනය සහ සංචිත**

ගෝලීය බලශක්ති මිල ඉහළ යාම නිසා ඉකුත් පෙබරවාරි මාසයේ 1.6% ක් ලෙස පැවති උද්ධමනය මැයි වන විට 5.5% දක්වා ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. රටේ ප්‍රධානතම ඩොලර් උල්පතක් වන සංචාරක පැමිණීම් මන්දගාමී වී ඇති අතර, මහ බැංකුවේ විදේශ සංචිත රැස් කිරීමේ වේගය ද දුර්වල වෙමින් පවතී. උද්ධමනය පාලනයට මහ බැංකුවට පොලී අනුපාත පදනම් ලකුණු 100කින් ඉහළ දැමීමට ද සිදු විය.

**නොකළහොත් වදින ඊළඟ ප්‍රහාරය**

ආර්ථික ඉලක්කවලට වඩා රාජ්‍ය පාලනය සහ ආයතනික ව්‍යුහයන් වෙනස් කිරීම කෙරෙහි අයිඑම්එෆ් මෙවර දැඩි අවධානයක් යොමු කර ඇත.

**මූල්‍ය අංශය සහ සයිබර් ආරක්ෂාව**

මූල්‍ය අංශ අධීක්ෂණය දැඩි කිරීම, සයිබර් ආරක්ෂණ මෙවලම් සහ මුදල් විශුද්ධිකරණ විරෝධී නීති ශක්තිමත් කරන ලෙස ඔවුන් ඉල්ලා සිටී.

**දේශපාලන බිය**

බදු ක්‍රමය, කම්කරු නීති, වෙළෙඳ ප්‍රතිපත්ති සහ ආයෝජන පරිසරය මුළුමනින්ම වෙනස් කළ යුතුය. මෙම සංවේදී ප්‍රතිසංස්කරණවලට දේශපාලන වශයෙන් බිය වුවහොත්, පවතින මූල්‍ය ස්ථාවරත්වයෙන් පමණක් රැකියා උත්පාදනයක් හෝ දිළිඳුකම පිටුදැකීමක් සිදු නොවන බව අයිඑම්එෆ් අවධාරණය කරයි.

තවද, රාජ්‍ය පරිපාලන අකාර්යක්ෂමතාව නිසා සුළි සුළඟින් විනාශ වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ ප්‍රමාද වීම ඔවුන්ගේ දෝෂදර්ශනයට ලක්ව ඇත. ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන් වෙමින් පැවතුණද, ඉදිරියේදී නැවත ණය උගුල්වල නොවැටීම සඳහා 'රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය' ස්වාධීනව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ව්‍යාප්ත අරමුදල් පහසුකමේ 7 වැනි සමාලෝචනයට ලංකාව සූදානම් වන විට, රජය මෙම අසීරු තීන්දු ගන්නවාද නැද්ද යන්න මත ඊළඟ ඩොලර් වාරිකය තීරණය වනු ඇත.' යනුවෙන් එහි සඳහන්ව තිබිණ.

## කාදිනල් හිමිගේ රහස

**කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම අප 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ තොරතුරු වාර්තා කරමින් කියා සිටියේ නුදුරු දිනකදීම උන්වහන්සේගේ සේවා කාලය අවසන් වීමට නියමිතව ඇති බවත්, ඉන් අනතුරුව උන්වහන්සේ විශ්‍රාම ගැනීමට නියමිතව ඇති බවත්ය. පාස්කු ප්‍රහාරය එල්ල වූ 2019 වසරෙන් පසු උන්වහන්සේ විශ්‍රාම යෑමට නියමිතව තිබුණත්, පාස්කු ප්‍රහාරයේ මහමොළකරුවන් සොයාගැනීම වෙනුවෙන් දියත් කළ සටන හේතුකොට ගෙන හිටපු පාප්වහන්සේ විසින් කාදිනල් හිමියන්ගේ ධුර කාලය වසර කිහිපයකින් දීර්ඝ කිරීමට වාචිකව කටයුතු කොට තිබූ අපි වාර්තා කර සිටියෙමු.**

නමුත් නව ලියෝ පාප්වහන්සේ පත්වීමෙන් පසු දැඩි ස්ථාවරයක සිටිමින් උන්වහන්සේ අවුරුදු 75 ඉක්මවූ සියලු කාදිනල් හිමිවරුන් විශ්‍රාම ගතයුතු බවට දැනුම් දීමක් කර තිබූ බවද අප මෙම තීරයේ වාර්තා කර සිටියෙමු. එය ක්‍රියාවට නංවමින් තමන්ට අතිශය හිතවත් කාදිනල් හිමිනමකද සේවයෙන් විශ්‍රාම ගැන්වීමට පාප්වහන්සේ කටයුතු කළ බවද අපි වාර්තා කර සිටියෙමු. ඒ අනුව අප පසුගිය ජූනි මස 07 වැනිදා මේ සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් ගෙන එමින් කියා සිටියේ 2027 ආරම්භ වනවිට ලංකාවේ නව අගරදගුරුතුමෙකු පත්කිරීමට වතිකානුව තීරණය කොට ඇති බවත්, ඒ සම්බන්ධයෙන් නම් 3ක් තමන් වෙත එවන ලෙසට කාදිනල් හිමියන්ට වතිකානුවෙන් දැනුම් දී ඇති බවත්ය. එම නම් 3ද සමග ජූනි මස 07 වැනිදා 'රාජ්‍ය රහස්' තීරයෙන් අප කළ අනාවරණය මෙසේය.

*අලුත් අගරදගුරු පියතුමෙක් එනවා...*

*කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් අවසන් වතාවට වතිකානුවට ගොස් සුළු මොහොතකට ලියෝ පාප්වහන්සේ මුණගැසී සාකච්ඡා කළ ආකාරයත්, එහිදී කාදිනල් හිමියන් තමන්ට සේවා දිගුවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටි ආකාරයත්, අවුරුදු 75 ඉක්මවීමෙන් පසු අගරදගුරු පදවියෙන් විශ්‍රාම යෑමේ සම්ප්‍රදාය පිළිබඳ දැනුම් දෙමින් පාප්වහන්සේ එය ප්‍රතික්ෂේප කළ ආකාරයත් මීට මාස ගණනාවකට ඉහතදී 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ විශේෂ අනාවරණයක් කරමින් අපි වාර්තා කළෙමු. එමෙන්ම එම හමුවේදී නව අගරදගුරුවරයා වශයෙන් පත්විය යුතු තැනැත්තා පිළිබඳ නම් තුනක් නම්කර එවන ලෙසද මැල්කම් රංජිත් හිමිපාණන්ට පාප්වහන්සේ විසින් දැනුම් දීමක් කර තිබිණි. අප ඒ බවද එකල රාජ්‍ය රහස් තීරයෙන් වාර්තා කිරීමට කටයුතු කළෙමු.*

*ඒ අනුව ලබන 26, 27 යන දෙදින ලොව පුරා සිටින කාදිනල් හිමිපාණන් වහන්සේලා වතිකානුවට කැඳවීමට ලියෝ පාප්වහන්සේ කටයුතු කොට තිබේ. ඒ අනුව ඊට කාදිනල් හිමිවරුන් 237ක් සහභාගි වීමට නියමිතව ඇති අතර, විශේෂ මාතෘකා කිහිපයක්ම එම හමුවේදී සාකච්ඡා වීමට නියමිතව ඇති බවක් දැනගන්නට ඇත.*

*එමෙන්ම අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ මැල්කම් රංජිත් කාදිනල් හිමියන්ද මෙවර වතිකානුවේ රැස්වීමට සහභාගි වීමට සූදානමින් සිටින බවත්, එහිදී ඊළඟ අගරදගුරු තනතුර සඳහා අලුත් නම් 3ක් පාප්වහන්සේ වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කොට ඇති බවත්ය. ඒ අනුව නිල නොවන තොරතුරුවලින් කියැවෙන්නේ කොළඹ සහායක අගරදගුරු වන බිෂොප් ඇන්තනී, කොළඹ සහායක අගරදගුරු වන ඇන්ටන් රංජිත් සහ ගාල්ල බිෂොප්වරයා ලෙස කටයුතු කරන රෙජිනෝල්ඩ් වික්‍රමසිංහ යන පියතුමන්ලාගේ නම් එසේ කාදිනල් හිමියන් විසින් නව පාප්වහන්සේ වෙත භාරදීමට නියමිතව ඇති බවය.*

*එමෙන්ම අපට දැනගන්නට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ මෙම හමුව සඳහා පාප්වහන්සේ කාදිනල් හිමියන්ට විනාඩි 3ක කාලයක් පමණක් ලබාදී ඇති බවය. ලබන නොවැම්බර් 15 වැනිදා අගරදගුරු මැල්කම් රංජිත් හිමිපාණන්ගේ පදවියේ ධුර කාලය අවසන් වීමට නියමිතව ඇති බැවින් ඊට මාස 2කට පෙරාතුව නව අගරදගුරුවරයා සම්බන්ධයෙන් වූ ඉඟිය පාප්වහන්සේ විසින් ලබාදීමට නියමිතය. ඒ අනුව 2027 වසර ආරම්භ වනු ඇත්තේ වසර ගණනාවකට පසු ලංකාවට අලුත් අගරදගුරුවරයකු පත්කරමිනි.*

*කෙසේ වෙතත් මෙම වතිකානු සංචාරයෙන් පසුව මැල්කම් රංජිත් හිමිපාණන් යළි ලංකාවට පැමිණෙන්නේ සුපුරුදු පරිදි යුරෝපා සංචාරයක නිරත වීමෙන් අනතුරුවය.*

*('රාජ්‍ය රහස්' ජූනි 07)*

ඒ අනුව අප කළ අනාවරණය මේ වනවිට තහවුරු වී ඇත්තේ පසුගිය සතියේ කතෝලික සභාව මාධ්‍ය වෙත නිකුත් කළ ලිපියක් සමගය. එම ලිපියෙහි එක් තැනක සඳහන් වන්නේ මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් 75 වැනි විය සපිරූ වහාම පාප්වහන්සේ වෙත සිය විශ්‍රාම ගැන්වීමේ ලිපිය යොමුකර ඇති බවය. මේ ආකාරයට පාප්වහන්සේ සිය විශ්‍රාම ගැන්වීමේ ලිපිය භාරදී ඇති බවක් පළමු වරට රටට අනාවරණ වූයේ කතෝලික සභාව විසින් මෙම ලිපිය නිකුත් කිරීමත් සමගය.

## ටිල්වින් - වරුණ හබය

**මේ දිනවල දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාව වී ඇත්තේ පාසල නායක හරක් කටාගෙන් රුපියල් කෝටි 20ක මුදලක් ගැනීමේ සිද්ධියක් මත හිටපු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතාගේ පුත් නීතිඥ රවිත රාජපක්ෂ මහතාත්, සජබ හිටපු ආසන සංවිධායකවරයකු වූ චරිත් අබේසිංහ මහතාත් අල්ලස් කොමිසම මගින් අත්අඩංගුවට ගැනීමේ සිද්ධියය. මෙම අත්අඩංගුවට ගැනීමෙන් පසු සජබය වහාම චරිත් අබේසිංහට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනිමින් පක්ෂයේ සියලු තනතුරුවලින් ඔහු ඉවත් කිරීමට පියවර ගෙන තිබිණි.**

කෙසේ වෙතත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඊට පසු දින මාධ්‍ය හමුවක් පැවැත්වූ සජබ ආසන සංවිධායකවරයකු වන වරුණ දීප්ත රාජපක්ෂ මහතා විශේෂ අනාවරණයක් කරමින් කියා සිටියේ ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා චරිත් අබේසිංහට දුරකතන ඇමතුමක් ලබාදීමක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කළ බවකි. ඒ සම්බන්ධයෙන් වරුණ රාජපක්ෂ මාධ්‍ය හමුවේ අදහස් පළ කළේ මෙසේය.

'මට මීට මාස දෙකකට වගේ කලින් චරිත් අබේසිංහ දවසක් දුරකතන ඇමතුමක් දෙනවා. දුරකතන ඇමතුමක් දීලා මගෙන් අහනවා වරුණ ඔයාට ටිල්වින් සිල්වා කතා කළොත් ඔයා කතා කරනවද කියලා. මං චරිත්ට කියනවා ඉතින් මට කතා කළොත් කතා කරනවා. නෑ මං අහන්නේ මේ එහෙම නෙවෙයි ඔයාට කතා කළොත් ඇත්තටම ඔයා කතා කරනවද? මං අහනවා චරිත් ඇයි ඔය මගෙන් අහන්නේ කියලා.

එතකොට චරිත් මගෙත් එක්ක කිව්වා ඔහුගේ ඉතාම සමීප හිතවතෙකු ඔහුට කතා කරලා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාව මුණගැහෙන්න, ජනාධිපතිවරයාට ඔහු මුණගැහෙන්න අවශ්‍යයි කියලා ඔහුට හමුවෙන්න ඕන කියලා කිව්වා කියලා. ඊට පස්සේ මං ඒකයි ඔයාගෙන් ඇහුවේ ඔයාට එහෙම කතා කළොත් ඔයා කතා කරනවද කියලා. මං එතකොට චරිත්ට කිව්වා චරිත් මට අනුරව හරි ටිල්වින්ව හරි හම්බවෙන්න ඕනේ නෑ. මට කතා කරන්න ඕනෙත් නෑ. මොකද මං මීට අවුරුදු පහළොවකට කලින් පැය ගානක් නෙමෙයි දවස් ගානක් කතා කරලා මට කතා කරන්න තියෙන දේවල් ඔක්කොම ඉවර කරගෙන තියෙන්නේ. හැබැයි ඔයාට මොකක් හරි හේතුවකට කතා කරනවා නම් ඔයා කැමැති නම් ඉතින් කතා කරන්න ඒකේ ප්‍රශ්නයක් නැතේ කියලා. චරිත් කිව්වා නෑ එහෙම එකක් නෙමෙයි ඒක පොඩි දේශපාලන කතාවක්. ඒකයි මං ඇහුවේ කියලා. ඊට පස්සේ මං දන්න විදිහට චරිත්ට හම්බ වුණේ නැහැ. හැබැයි මං ඕක ගැන කා එක්කවත් කියන්න ගියේ නැහැ. ඉතින් පෞද්ගලික කෙනෙක්ට කරපු කතාබහක් හින්දා...' යැයි වරුණ රාජපක්ෂ එහිදී කියා සිටියේය.

කෙසේ වෙතත් වරුණ මෙම ප්‍රකාශය කොට පැය 24ක් යෑමට මත්තෙන් ටිල්වින් සිල්වා ඊට ප්‍රතිචාර දැක්වීමට පියවර ගෙන තිබිණි. ජවිපෙ ලිපි ශීර්ෂය යටතේ නිවේදනයක් නිකුත් කරමින් ටිල්වින් කියා සිටියේ වරුණ කළ එම ප්‍රකාශය සම්පූර්ණයෙන් අසත්‍යයක් බවත්, ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තමන් කටයුතු කරන බවත්ය.

මාධ්‍ය නිවේදනයයි

අද (26) සමගි ජන බලවේගය විසින් පවත්වන ලද මාධ්‍ය හමුවකදී වරුණ රාජපක්ෂ නැමැත්තා විසින් සිදු කොට ඇති බරපතළ සාවද්‍ය ප්‍රකාශයක් පිළිබඳව කරුණු පැහැදිලි කළ යුතුව ඇත.

මෙම මාධ්‍ය හමුවේදී ඔහු ඊයේ (25) දිනයේ අල්ලස් චෝදනා මත අත්අඩංගුවට ගැනුණු චරිත් අබේසිංහ නම් පුද්ගලයාට මාස 02කට පෙර අප පක්ෂයේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් දුරකථන ඇමතුමක් ලබා දී ඇති බවත්, ජනාධිපතිවරයා හමුවීමට පැමිණෙන ලෙසට ආරාධනා කර ඇති බවත් ප්‍රකාශ කරයි.

මෙම ප්‍රකාශය මුළුමනින්ම අසත්‍ය වන අතර එබඳු ප්‍රකාශයක් පාතාල සබඳතා හා බැඳුණු අල්ලස් සිදුවීම හමුවේ සමගි ජන බලවේගය පක්ෂයක් ලෙස කෙතරම් කලබල වී ඇත්ද යන්න හා බංකොලොත් වී ඇත්ද යන්න පෙන්වා දෙයි. අනෙක් අතට වරුණ රාජපක්ෂ නැමැත්තා ලවා මෙබඳු අතේ රෝලක් මාධ්‍ය හමුවේ කියවීමට තරම් තිවට තත්වයකට සමගි ජන බලවේගය වැනි පක්ෂයක් වැටී තිබීම කනගාටුදායකය.

වෙනත් පක්ෂවලට විවිධ වුවමනාකම් මත පසුබිම නොසලකා පුද්ගලයින් එකතු කර ගැනීමට අවශ්‍ය වුවද අපරාධකරුවන් අප පක්ෂයට හෝ ආණ්ඩුවට එකතු කර ගැනීමට අපට කිසිදු අවශ්‍යතාවක් නොමැත. එසේම මෙබඳු සාවද්‍ය ප්‍රකාශ කොට ඇතැමුන් අපරාධමය සිදුවීම්වලට ලැබිය යුතු සමාජ අවධානය වෙනත් අතකට යොමු කිරීමට සහ අපරාධකරුවන්ට සුදුහුණු ගෑමට දරන උත්සාහයද නිෂ්ඵලය.

මෙම තත්වය තුළ අසත්‍ය ප්‍රකාශ සිදුකරමින් අප පක්ෂයට අවලාද නැගීමට සමගි ජන බලවේගයේ ඇතැමුන් දරන උත්සාහය දැඩිව හෙළා දකින අතර මෙම සාවද්‍ය ප්‍රකාශයන් එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පසුබට නොවන බවද අවධාරණය කරමු.

මාධ්‍ය ඒකකය
ජනතා විමුක්ති පෙරමුණ
2026.06.26

කෙසේ වෙතත් ටිල්වින් විසින් මෙම නිවේදනය නිකුත් කොට මොහොතක් ගතවීමට මත්තෙන් නැවත වතාවක් වරුණ සිය සමාජ මාධ්‍ය ජාලයේ විශේෂ ප්‍රකාශයක් කරමින් ඊට අභියෝග කිරීමට කටයුතු කිරීම විශේෂ සිදුවීමක් විය. එහිදී වරුණ ටිල්වින් සම්බන්ධයෙන් කියා සිටියේ මෙවැනි කතාවකි.

'අපි මේ වැඩසටහන බලන ජනතා විමුක්ති පෙරමුණේ හිතවතෙක් ඉන්නවා නම් තහවුරු කරලා කියන්න මේක ෆේක් එකක්ද නැද්ද කියලා. මොකද ඇත්තටම මට හිතුණා මේක දැක්ක ගමන් නිකන් මේ වගේ මෝඩ වැඩක් ජනතා විමුක්ති පෙරමුණෙන් කරනවා කිව්වම මේක ෆේක් එකක් වෙන්නත් පුළුවන් කියලා. නමුත් මේක මාධ්‍යයට යවලා තිබුණා. ඒ නිසා මං හිතන්නේ ඇත්ත එකක් කියලා.'

'මාධ්‍ය නිවේදනයේ සඳහන් වෙලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය ඒකකය. 06/26 තමයි මේ මාධ්‍ය නිවේදනය යවන්නේ. ඉතින් මේක ඇත්ත එකක් නම් පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය අංශයට. මං හිතන්නේ ඒක භාරව කටයුතු කරන්නේ ටිල්වින් සිල්වා මහත්මයා ජනතා විමුක්ති පෙරමුණේ.

ඒක නිසා මේක මාලිමාවේ නෙවෙයිනේ. ඉතින් ඒ නිසා ඔහුට ස්තුතිවන්ත වෙන්න ඕනෙ. මොකද ඊයේ මම කරපු මාධ්‍ය සාකච්ඡාව වෙනුවෙන් තව මාධ්‍ය නිවේදනයක්, ඒ කියන්නේ සමගි ජන බලවේගයේ මාධ්‍ය සාකච්ඡාවක් වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණෙන් මාධ්‍ය නිවේදනයක් දාලා ඒ මාධ්‍ය සාකච්ඡාව බලන්න අවධානය අරන් දෙනවා කියලා කියන්නේ ඒක වෙන ලෙවල් එකක වැඩක්නේ. ඒක මරු, තෑන්ක් යූ.'

'ඊළඟට මෙහි සඳහන් වෙලා තියෙන කරුණු කීපයක් ගැන කියන්න ඕනෙ. එකක් තමයි මේකේ තියෙනවා මේ 'සමගි ජන බලවේගය විසින් පවත්වන ලද මාධ්‍ය හමුවකදී වරුණ රාජපක්ෂ නමැත්තා විසින් සිදුකර ඇති බරපතළ සාවද්‍ය ප්‍රකාශයක් පිළිබඳ කරුණු පැහැදිලි කළ යුතුයි' කියලා.

මේකේ සඳහන් වෙලා තියෙනවා 'අප පක්ෂයේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් දුරකතන ඇමතුමක් ලබාදී ඇති බවත් ජනාධිපතිවරයා හමුවීමට පැමිණෙන ලෙසට ආරාධනා කර ඇති බවත් ප්‍රකාශ කරයි' කියලා. ඒ කියන්නේ මම කිව්වා කියලා ටිල්වින් සිල්වා දුරකතන ඇමතුමක් දීලා තියෙනවා සහ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාව හම්බවෙන්න එන්න කිව්වා කියලා.'

'මං හිතන්නේ මම මේක කළේ සිංහල භාෂාවෙන්. මං හිතන්නේ සිංහල භාෂාව පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් තියෙනවා නම් එහි සඳහන් වෙලා තියෙන්නේ මේ මාධ්‍ය නිවේදනයේ සඳහන් වෙන කරුණුද කියලා ඒක අහලා ඕගොල්ලොම තීරණය කරන්න. ඒ කියන්නේ මීට මාස දෙකකට පෙර අප පක්ෂයේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් දුරකතන ඇමතුමක් ලබාදී ඇති බවත්, ජනාධිපතිවරයා හමුවීමට පැමිණෙන ලෙස ආරාධනා කර ඇති බවත් ප්‍රකාශ කරයි.

මං හිතන්නේ මේක ටිල්වින් සිල්වා මේ මාධ්‍ය නිවේදනය දැක්කේ නැත්නම් හෝ මගේ මාධ්‍ය සාකච්ඡාව ඇහුවේ නැත්නම් මම හිතන්නේ ටිල්වින් සිල්වා මහත්මයාටත් මේ කොටස සම්පූර්ණ අහන්න වෙලා නැති වෙන්නත් පුළුවන්නේ. මේ කොටස අපි උපුටලා දක්වනවා. ඒක අහලා ඔබේ මාධ්‍ය අංශයට එක්කෝ සිංහල භාෂාව පිළිබඳ අවබෝධයක් ලබාදෙන්න. එහෙම නැත්නම් වහාම මාධ්‍ය ඒකකයේ ඉන්න අයට යම්කිසි දෙයක් තේරුම් ගන්න පුළුවන් පිරිසක්ව එකතු කරගන්න.'

'දෙවැනි කාරණාව මේකේ කියනවා 'වෙනත් පක්ෂවලට විවිධ වුවමනා එපාකම් මත පසුබිම නොසලකා පුද්ගලයන් එකතු කරගැනීමට අවශ්‍ය වුවද අපරාධකරුවන් අප පක්ෂයට ආණ්ඩුකරණයට එකතු කරගැනීමට අපට කිසිදු අවශ්‍යතාවක් නැත' කියලා.

හැබැයි අපිට මතකයි අනුර කුමාර දිසානායක පාර්ලිමේන්තුවේදී කිව්වා ඊබ්‍රාහිම් නානා ගැන කියද්දි 'අපි කාලා බලලා නෙවෙයි ගත්තේ' කියලා. ඉතින් ඊබ්‍රාහිම් නානාගේ පසුබිම, ඒ කියන්නේ මේකේ කියනවා මේ 'අප පක්ෂය විවිධ වුවමනාවන් මත පසුබිම නොසලකා පුද්ගලයන් එකතු කරගන්නේ නෑ' කියලා. සමහරවිට මං හිතන්නේ ඒ තීරණය ගන්න ඇත්තේ ඊබ්‍රාහිම් නානාගේ සිද්ධියෙන් පස්සේ වෙන්න ඇති. ඒ නිසා අපි ඒකට සමාව දෙමු.'

'ඊට පස්සේ මේකේ සඳහන් කරලා තියෙනවා ' සමගි ජන බලවේගයේ ඇතැමුන් දරන උත්සාහය දැඩිව හෙළා දකින අතර, මෙම සාවද්‍ය ප්‍රකාශයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පසුබට නොවන බවත් අවධාරණය කරමු'. නීතිමය ක්‍රියාමාර්ග ගන්න එක ඉතින් ඉතාම හොඳයිනේ. රටේ නීතියක් තියෙනවනේ. ඒ නීතිය අනුව කටයුතු කරන එක හොඳයි බලනහර ඒකකයක් වගේ ඒකකයක් යොදවන්නේ නැතුව සාමාන්‍ය නීතිය අනුව කටයුතු කරන එක.

කාට හරි නීතිමය වශයෙන් මොකක් හරි දෙයක් වුණා නම් ඒක ඉතාම හොඳ තීරණයක්. ඒක ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා. මොකද මේ අර වෙන ආකෘතියේ පාවිච්චි කරන අසූචි ඒකක, බලනහර ඒකක වගේ ඒකක වෙනුවට මේ නීතිය ක්‍රියාත්මක කරන එකට.' යනුවෙන් එහිදී වරුණ කියා සිටියේය.

**කපිල පුංචිමාත්තගේ**



මව්රට

# සදහම් සිසිල

## සම්මා සම්බුදු දහම බුද්ධියෙන් විමසමින් අපගේ ජීවිතවලට ගලපන දහම් කතිකාවත

පොසොන් පුන් පොහොය නිමිත්තෙන්, 'මව්රට' ජාතික පුවත්පතේ පූර්ණ අනුග්‍රහයෙන් සහ තලමල්ගම පොලිසියේ මූලිකත්වයෙන් 'මව්රට සදහම්' සිසිල විශේෂ කාව්‍යමය ධර්ම දේශනාව පසුගිය ජූලි 01 වැනිදා හොරොව්පතාන කුඩාගම ශ්‍රී බෝධිමළු විහාරාධිකාරී, කාව්‍ය ශ්‍රී පූජනීය මහවැවේ ධම්මවංශ හිමියන්ගේ වැඩමවීමෙන් පැවැත්විණි. මෙයට සමගාමීව භක්ති ගීත, පහන් කූඩු තරග මෙන්ම රොටී, කඩල සහ බෙලිමල් දන්සල්ද පැවැති අතර මෙම පින්කම් සංවිධානය තලමල්ගම පොලිසියේ ස්ථානාධිපති නවරත්න මහතා ඇතුළු මහත්ම මහත්මීන් විසින් සිදුකරන ලදී.

මහවැවේ ධම්මවංශ හිමි

වෙහෙරගල රජමහා විහාරාධිකාරී පූජ්‍ය කල්පිටියේ ධම්මදස්සි හිමි

පොලිස් පරීක්ෂක නවරත්න මහතා තලමල්ගම පොලිස් ස්ථානාධිපති

නිවේදක ආර්.එම් සිසිර කුමාර

කොළඹ 05, කිරිමැණ්ඩිය, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ඩිපෙන්ඩන්ට් නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින්, මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර, අංකः 102/176හි පිහිටි සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී 2026 ජූලි 05 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.